තැපැල් කර්යාලයේදී ලියාපදිංචි කරන ලදී QD/61 නිවුස් 2015

# ශක්තිය

ප්‍රගතියේ ජනහඬ කැටුව එන පුවත්පත

වෙළුම 13 | කලාපය 09
2015 නොවැ./දෙසැ. | මිල රු.20/-



# ජනතාව මරාගෙන උපදින අයවැයක්

**2016 වර්ෂය සඳහා ඉදිරිපත් කිරීමට නියමිත අයවැය නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති හා සංකල්ප මත පිහිටා සකස්කරන ජනතාව මරාගෙන උපදින අයවැය ලේඛණයක් වනු ඇතැයිද එමඟින් ඉහල ආදායම් ඇති පවුල් හැර සමාජයේ සෑම ස්ථරයකම ජනතාව අර්බුදයෙන් අර්බුදයට යනු ඇති බව ආර්ථික විශ්ලේෂකයන්ගේ මතයවේ. 2007 න් ඇරඹුනු ලෝක ආර්ථික අවපාතය ඇමෙරිකාව හැරුනු විට යුරෝපා රටවල ආර්ථිකයන් තවදුරටත් පහලට ඇදඳමා ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව පවා මෑතකදී ප්‍රකාශ කර ඇති තත්ත්වයක් තුල එම අහිතකර ලෝක ආර්ථික පරිසරය යටතේ හවුල් ආණ්ඩුවේ මෙම අයවැයද වැඩකරන ජනතාවගේ ගෙල මිරිකනු ඇති බවත් පැවසේ. ලෝක ආර්ථික අර්බුදය පැවතුනත් ශ්‍රී ලංකාව 2005 සිට 2014 දක්වා (යුද්ධය පැවති 2009 හැර) අඛණ්ඩව 6% සිට 7% දක්වා පමණ වර්ධන අගයක පවත්වා ගන්නා ලදී එසේ වුවත් 2015 සිට ආර්ථික වර්ධනය තියුනු ලෙස පහල බැසීමට ඉඩ ඇති බවද එම ආර්ථික විශ්ලේෂකයන්ගේ මතයයි.**

ඉදිරි අයවැය ගැන පුරෝකථනයක් කල වාසුදේව සහෝදරයා ශක්තියට මෙසේ පැවසීය. ''අප ආර්ථිකය මුහුණ දෙන ප්‍රධාන අභියෝගයන් ගණනාවකි. එහි පළමුවැන්න විදේශ විනිමය සංචිතයේ අඩුවීමය. එය පසුගිය වසර වන විට ඇ. ඩො. බිලියන 10 කට ආසන්න සංඛ්‍යාවක පැවතියත් මේ වන විට එය බිලියන 6 ක් පමණ දක්වා අඩුවී ඇති බවත්, ආනයන වියදම් වැඩිවන විට විදේශ සංචිත වල ප්‍රමාණයද අඩුවන බවත් එහි ප්‍රතිඵලය තවදුරටත් රුපියල බාල්දු වීම'' බවත් පැවසීය. ''ඒ අනුව ඇ. ඩො. 1 ක් සඳහා ගෙවිය යුතු රුපියල් ප්‍රමාණය ඉදිරියේදී රු. 150/-- ක් පමණ දක්වා වැඩිවීමෙන් ආනයන මිල සීඝ්‍රයෙන් වැඩිවී ආනයනය සීමා කිරීමට සිදුවන බවත්, එවිට සංචිතය රැකුනත්, ජීවන වියදම් බර ඉතා වේගයෙන් වැඩිවීමට එයම හේතුවක් වනු ඇති බව'' පෙන්වා දෙන ලදි. ඔහු වැඩිදුරටත් පැවසුවේ ''ඉදිරි වසර තුල ඩොලර් බිලියනයක් පමණ ණය පොලී ගෙවීමට වෙන් කළ යුතු බවත්, ආනයන අඩුවීම සමඟ රජයේ ආදායමද අඩුවෙයි. දැනටමත් රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් 12% පමණය. රටක ආර්ථිකය යම් මට්ටමක පවත්වා ගැනීමට නම් අවම වශයෙන් රජයේ ආදායම දළ දේශීය නිශ්පාදනයෙන් 25% ක් වත් වියයුතු බවත් එසේ සිදු නොවුනොත් පවතින සහනාධාර තවදුරටත් රජය නොගෙවා හැරීමට ඉඩ ඇති'' බවද පෙන්නා දුන්නේය.
අප මුහුණ දෙන බරපතල අභියෝගයවන්නේ ණය බරතාවය බවත් මේවන විට අපට දරාගතහැකි ණය ප්‍රමාණය ඉක්මවා ඇති බැවින් එයද ආර්ථිකයට බලවත් තර්ජනයක් බවත්, එය විදේශ ඉපයීම් වලින් 25% දක්වා නැගීමෙන් ආර්ථිකයට රතු එලියක් පෙන්නුම් කර ඇති බවත් ආර්ථික විද්‍යාඥ ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා පැවසයි.
1977 වන විට රජයේ ආදායම 24% ක ප්‍රමාණයේ පැවති බවත් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදීමත් සමඟ එය සීඝ්‍ර බැස්මකට ගමන්කර ඇති බවත්, මෙම තත්වය මගහරවා ගැනීම සඳහා අපගේ බදු ප්‍රතිපත්තියේ වෙනසක් සිදු කිරීම වහාම කල යුතු බවත්, 1978 සිට සෑම රජයක්ම සිදුකලේ සාමාන්‍ය ජනතාව මත වැඩි වැඩියෙන් බදු බර පැටවීම බවත් වක්‍ර බදුවල එම ප්‍රතිශතය 88%ක් වූ බවත්, අදායම් බදු නිලධාරින්ගේ සංගමයේ නියෝජිතයෙකු පෙන්නා දුන්නේය. ආයෝජකයින් දිරිගැන්වීම සඳහා යයි බවසමින් ධනවතුන් හා සමාගම්වලින් සෘජු බදු අඩු කර ආදායම් බදු සහන ලබාදීම මඟින් රජයේ ආදායම් අඩුවීම දිගටම සිදු වන බවත් ඔහු විසින් වැඩිදුරටත් පෙන්නා

## රනිල් වික්‍රමසිංහ
# මහ බැංකු මගඩියේ විත්තිකරුවෙක්

පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර සහෝදරයා විසින පොලිස්පති වෙත යොමු කරන ලද ඉහත කරුණට අදාල ලිපියට වැඩබලන පොලිස්පතිගේ අංක ස්ටාෆ්ඩීඅයිජී/අයිජී/ඕයූටී/08 1716/2015 හා 2015-11-08 දින දරණ ලිපියෙන් මතු කරන ලද කරුණු දෙකක් මුල් කර පිලිතුරු ලබා දී ඇති බව ශක්තියට වාර්තාවේ.

2015 මහ බැංකුවේ ප්‍රශ්ණගත බැඳුම්කර නිකුතුව පිලිබඳ කරුණු සොයා බැලීමට පත් කළ ත්‍රි පුද්ගල කමිටුවේ වාර්තා පිටපතක් 2015-04-27 වෙනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බවත්, එමගින් අපරාධමය චෝදනාවක් අනාවර්නය වන්නේදැයි යන්න පිලිබඳව උපදෙස් ලබා ගැනීමට අදාල විමර්ශන ගොනු 2015-05-30 දින නිතිපති වෙත යවා ඇතත් ඊට අදාලව තවමන් පිලිතුරු ලබා දී නොමැති බව වැඩබලන පොලිස්පති දන්වාසිටී.

ඊට අමතරව වාසුදේව මන්ත්‍රීතුමා මතු කළ අනෙක් කරුණ වූ ලංකා මැරින් සමාගමේ වත්කම් අක්‍රමික ලෙස විකිනීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක එස්සීඑම්ආර් 209/2007 ගොනුකර ඇති පෙත්සමට අදාල නඩු තීන්දුව පරිදි මතුවූ කරුණු ගැන විමර්ශනයක් ආරම්භ කිරීමට පොලිස්පති තුමා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට 2007-07-21 දින යොමු කර විමර්ශන උධෘත නීතිපති උපදෙස් සඳහා 2008-12-08 නීතිපති දෙපාර්තමේන්තුවට යවා ඇතත් මෙතෙක් උපදෙස් ලැබී නොමැති බවද ඉහත ලිපියෙන්ම වැඩබලන පොලිස්පති දන්වා තිබෙන බව වාර්තා වේ.

## අගමැතිට විරුද්ධ එජාපය තුල අනියම් කැරැල්ලක්

ඇවන්ට්ගාඩ් සිද්ධිය පමණක් නොව මහ බැංකුවේ බැදුම්කර ගැන ද, ගල් අගුරු ටෙන්ඩරය ගැන ද එක්සත් ජාතික පක්ෂයේ අවංක මන්ත්‍රීවරුන් අතර සිත් තැවුල් හට ගෙන තිබෙන බව පාර්ලිමේන්තු- ලොබියේදී අසන්නට ලැබේ.

මෑතකදී අරලියගහ මැදුරේ පැවැත්වුණු ආණ්ඩු පක්ෂයේ එ.ජා.ප කණ්ඩායමේ රැස්වීමකදී රාජිත සේනාරත්න ඇමතිතුමා රජයේ සමහර ඇමතිවරුන් පසුගිය ආණ්ඩු කාලයේ සිදු කරන ලද හොර මැරකම් වැසීමට උදව් දෙමින් සිටිතැයි තදින්ම දෝෂාරෝපණය කලේ මන්ත්‍රීවරුන් බහුතරයකගේ ප්‍රබල අත්පොලසන් හඬ මධ්‍යයේය.

දුෂණ හා හොර මැරකම් පිලිබද පරික්ෂණ නියම ලෙස සිදු නොකිරීම ගැන ජනතා විමුක්ති පෙරමුරෙණ් අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින්

## මත විමසුමෙන් කලබැගෑනියක්

ඉදිරි පළාත් පාලන මැතිවරණය පිලිබඳව කෑගල්ල දිස්ත්‍රික්කයේ හිටපු පළාත් පාලන මන්ත්‍රීවරුන් හා පළාත් සභා මන්ත්‍රිවරුන්ගේ සාකච්ඡාවක් සබරගමුව මහ අමාත්‍යතුමාගේ නායකත්වයෙන් පවත්වා තිබේ.

එහිදී මෛත්‍රිපාල ජනාධිපති තුමාගේ දැනුම්දීමක් ලෙස ප්‍රකාශයට පත් කරමින් මහ ඇමතිතුමා කැඳවීම පිලිබඳ විස්තරය සභාව

වසරකට ඇවන්ගාඩ් නිසා නාවික හමුදාවට මිලියන 1000ක් අලාබයි

**ප්‍රවෘත්තියක්**

එහෙනං ඉස්සර ඇමති මණ්ඩලයේ කරලා තියෙන්නේ කොළ හංගලා ඕමී ගැහීමක් නේ ඕයි

**- ලැන්ටි**



ශක්තිය
49 1/1, විනයාලංකාර මාවත, කොළඹ 10.
දුරකථනය: 011 2684820
ෆැක්ස්: 011 2684820
විද්‍යුත් තැපැල :Shakthiya85@gmail.com
www.shakthiya.org


## ඔට්ටුයි බැරුවට.

ළඟාවෙන පුංචි ඡන්දයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජයග්‍රහණය කරවන්නට මෛත්‍රී ජනාධිපතිතුමා සූදානමින් සිටී. ඒ බැව් එතුමාගේ සුපුරුදු වදනින් විකාශනය විය. කොතරම් දුරට එතුමාගේ සූදානම පිලිගැනීමට ශ්‍රී ල.නි.පක්ෂයේ ඡන්ද දායකයා සහ සාමාජිකයා සූදානම්දැයි සොයා බැලිය යුත්තකි. සන්ධානයෙන් බැහැරව ගොස් එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ සන්ධානයෙන් අපේක්ෂකයා වී පසු කිහිප දෙනෙකුගේ සැලසුමක් මත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තොප්පිය දමා ගෙන පක්ෂය දිනවීමට පාරුම්බෑම කාන්තාරයේ මුරගෑමකි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇතැම් නායක, නායිකාවෝ අද බාගෙට ඇඳගෙන යූ.ඇන්.පි.ය සමඟ හෙළුවෙන් නටන අන්දම ජනතාව බලා සිටී. ඔවුන්ට දේශපාලන ප්‍රතිලාභයේ කැසිල්ල ඇත. ප්‍රතිපත්ති නැත. සනුහරෙන් කැඩී බිඳී වෙන්වී ගෙන්දගම් පොලොවේ සල්ලන් වී, දෙන දෙයක් කකා වෙන දෙයක් බලා ඉන්නවා. දැන් කතාවට එළඹෙමු.

එදා ඇරඹූ ජනතා බලවේගය සිඳ බිඳ දැමුවේ පිටසක්වල ජීවීන් නොවෙයි. අගෝස්තු මැතිවරණයේදී සන්ධානයේ ජයග්‍රහණයට වළකැපුවේ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් කවුදැයි කවුරුත් දනියි. නොවෙයි. මැතිවණ සමයේ පක්ෂ ප්‍රබලයෝ අත්අඩංගුවට ගනිමින් අධිකරණය හමුවට පමුණුවමින් මානසිකව බෙලහීන කලේ පක්ෂයේ ''නායකයෝ හා නායිකාවයි''. විධායක සභාවට ස්වකීය හිතවාදීන් පත් කරනු ලැබූහ. රටවටා යාමට සූදානම්ව තිබූ මහින්ද-මෛත්‍රී රජයක් උදෙසා රැස්වීම් උණුසුම් වෙද්දී මහින්දට නාමයෝජනා හෝ අගමැතිකම නොදෙන්නට තීරණය කළ බවද මහින්දට විරුද්ධව චෝදනා වැලක්ද රටට ප්‍රකාශ කලේ කවුද? නැවත ශ්‍රී ල.නි.ප. ජයග්‍රහනය ගැන කතාකරද්දි මෙවැනි අද්භූතයන් නිරාකරණය කල යුතුය. කොටසක් ආණ්ඩුවේ කොටසක් විපක්ෂයේ තවත් කොටසක් එලියේ අනික් කොටස ගැලවිලා ගිහින් තවත් සමහරු බල තණ්හාවේන් ඔද්දල්ව බෙදුම්වාදීන්ගේ තුවාල සොදාන්න පටන් අරන්ය. අගමැතිගේ ආශිර්වාදයෙන් ජිනීවා නුවරදී ඇමරිකානුවන්ගේ ලංකාව පිලිබඳ අවමංගල්‍ය යෝජනාව සම්මත විය.


පසුගිය පාර්ලිමේන්තු මැතිවණයට පෙරද සන්ධානය ජයග්‍රහණය කරවන බව ජනාධිපති වූ සැනින්ම එතුමා ප්‍රකාශ කලේය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති හා සන්ධානයේ නායකයා ද වෙයි. එහෙත් සන්ධානයේ විධායක සභාව රැස් කරන්නේ නැත. එතුමා අන්තිමට සිදු කළේ එක්සත් ජාතික පක්ෂයට ඉඩ විවර කිරීමය. යූ.එන්.පී.ය ජයග්‍රහනය කල යුතුය යන ස්ථාවරයේ හිදිමින් හිටපු පක්ෂ නායිකාව ද ක්‍රියා කලාය. ඇය කීවේ මහින්දට විරුද්ධව සිරිසේන ඡන්දය දෙන්න කියාය. ඉදිරියට සිදුවනුයේ ද එහි ප්‍රතිවිපාක විදිමයි. එය දේශපාලන උපාය මාර්ග පිලිබඳ ප්‍රවීණයන්ගේ ද මතයයි. ශ්‍රී ල.නි.ප.යේ හා සන්ධානයේ උරුමය හා සන්තකය ඒකාබද්ධ විපක්ෂය බරසාර ලෙස කර තබාගෙන ජනතාව අතරට යද්දී සිරිසේන ජනාධිපති තුමාට හා ගෝලයන්ට ඉතිරි වන්නේ හිස් මල්ලක් පමණි. ඒ හැර පැසිස්ට් වියවරුවට හූමිටි කියමින් අධිරාජ්‍යවාදීන්ට මල්පූජා කල බඩගෝස්තරවාදීන් අතරමං වනු නියතය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මැදමාවත දක්ෂිනාංශයට උගස් තියලා එහිම ලැගලා ඉඳගෙන කරන්නේ මොන කථාද?

# ආණ්ඩුව බටහිර බලවතුන්ගේ මනදොල සපුරා දේශපාලන හා මිලිටරි නායකයෝ පාවා දෙයි



පසුගිය දා ජිනිවාහිදි එක්සත් ජාතින්ගේ තිස්වෙන සැසිවාරය පැවැත්විනි. එහිදි වැදගත්ම කාරිය වුයේ ශ්‍රී ලංකාවට එරෙහිව තිබෙන යුධ අපරාධ චෝදනා පිලිගැනීමයි. පසුව එම චෝදනා විභාග කිරිම සදහා විදේශ විනිසුරෝ, විදේශ අධිචෝදකවරු හා උපදේශකවරු පත් කිරිමට ද තීරණය වෙයි. විත්ති පාර්ශවයට ද විදේශ උපදේශකයෝ ඉදිරිපත් කරවීමේ අවස්ථාව සලසාලමින් දෙමුහුන් අධිකරණයක් ගැන තීරණයකට එළඹෙයි.
ශ්‍රී ලංකා ද්වීපය ත්‍රස්තවාදයෙන් මුදවාගත් විරෝධාර රණවිරුවන්ට දෙමුහුන් අධිකරණය ඉදිරියේ පෙනී සිටිමට සිදුවෙයි. මෙහිදි අන්තර් ජාතික මානුෂවාදී නීතිය හා අන්තර් ජාතික මානව හිමිකම් නීතිය උල්ලංඝනය වී තිබෙන බවට ස්ථාපිත අධිකරණය සැහීමට පත්වුවහොත් එම වාර්තව එක්සත් ජාතින්ගේ ආරක්ෂක මණ්ඩලයට යොමු කර ඉන් කෙරෙන නිර්දේශය මත නෙදර්ලන්තයේ හේග් නගරයේ පිහිටි අන්තර් ජාතික අපරාධ අධිකරණයට මෙරට දේශපාලන හා මිලිටරි නායකයෝ රැගෙන යයි. ඇමරිකාව ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදීන්ගේ න්‍යාය පත්‍රය එයයි. මෙම පසුබිම නිර්මාණයව තිබෙනුයේ ජාත්‍යන්තර ද්‍රවිඩ ඩයස්පෝරාවේ පෙළඹවීම, උසිගැන්වීම හා උවමනාව නිසා බව අමතක නොකල යුතුය. මෙරට වෙසෙන වෛරීය දේශපාලඥයින්ගේ මෝහිණිය හඩ ද ඊට මුසුවෙයි.
ජිනිවා තිස්වෙනි සැසි වාරයේදී රුසියාව හා පකිස්ථානය ශ්‍රී ලංකාවට පක්ෂපාතීව කතා කරද්දී අප රටේ නායකයෝ නිද්‍රාශීලි පිලිවෙතක් අනුගමනය කර තිබීම කණගාටුදායක.ය. එය ශෝචනීය තත්ත්වයකි. නමුත් ඔවුන් තවමත් පුන පුනා පවසනුයේ ඇමරිකානු යෝජනාවට සම අනුග්‍රහයකත්වය ලබා දුන් නිසා ලෝකය දිනාගත් බවයි. රට පරාජය වුවත් ඔවුන් දිනු බව නම් සත්‍යයකි. පම්පෝරි දොඩන පාලකයෝ සිදු කර තිබෙනුයේ මේ පුංචි රටේ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කල අමානුෂික ලෙස ජීවිත ලක්ෂ ගණනක් බිලිගත් ත්‍රස්තවාදීන් මෙල්ල කල ශ්‍රී ලංකා ද්විපයේ නිදහස් නිවහල් බව ලොවට ජනිත කල දේශපාලන නායකයෝ හා උදාර රණවිරුවෝ නිවට නියාලු තත්වයට ඇද දැමීමයි. රටේ ප්‍රධානීයාටත්, ආණ්ඩුවටත් අවශ්‍යව තිබෙනුයේ මව්බිම කැබැලිවට බෙදා බටහිර බලවතුන්ගේ මනදොල සපුරා ස්වකීය ලෝක අභිමානය ගොඩනගා ගැනීමයි. ද්‍රවිඩ ඩයස්පෝරාවේ ලණු කෑ බටහිර බලවතුන්ගෙන් ඊට අවශ්‍ය පිඹුරුපත් සකස් කෙරුණි.
ලංකාවේ එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදය තිස්වකරට අධික කාලයක් පැවතුනි. එම මතකයන් ටිකක් අවධි කරනු. ඔවුන්ගේ ඝාතන සංස්කෘතිය ඇරඹුනේ යාපනය නගරාධිපති දෝරේඅප්පා ඝාතනයෙනි. එය 2009 දී නන්දිකඩාල් කලපුවෙන් නිමාකරවන තෙක්ම ක්‍රියාත්මක විය. මෙම කාලසීමාව තුල දිනෙන් දින මිනිස් ඝාතන හා විනාශකාරි ක්‍රියා උග්‍ර විය. ගොවි බිමේදී ගොවියෝ හා ගෙවිලියෝ අමු අමුවේ මරා දැමූහ. තමනට අවනත නොවන කාන්තාවන්ගේ පියයුරු කපා දැමූහ. කුඩා දරුවන් පවා කපා කොට මරා දමමින් පූජනීය ස්ථාන වනසා දැමූහ. රටේ සංවර්ධනය ඇන හිටුනි. රට තිස්වකරට ආ පස්සට හැරුණි. මෙවැනි කෲර සිත් පිත් නැති ත්‍රස්තවාදීන්ට දැක්විය යුතු ප්‍රතිචාරය කුමක්ද යන්න ගැන එක්සත් ජාතින්ගේ මානව හිමිකම් කවුන්සලයෙන්ම පෙරලා ඇසිය යුතු ප්‍රශ්නයකි. ඔවුන්ට දේශපාලන ප්‍රතිපත්තියක් නොතිබුණි. චින්තනයක් හෝ වෙනත් දර්ශනයක් ද නැත. සියල්ල සිදු කලේ ද්‍රවිඩ ජාතිවාදය ඉස්මතු කර ගනිමිනි.
ලංකාවේ හමුදාව කටයුතු කළේ ත්‍රස්තවාදය මැඩලීම සදහාය. එය රටේ අභ්‍යන්තර ප්‍රශ්නයකි. අප රටේ පවත්වා නීතියට අනුව බලගැන්වමෙනි. නීතියක් උල්ලංගනය කලාය යන්න චෝදනා කල හැක්කේ රටේ පවත්වා නීතිය හා වරදක් බව දන්නා නීතිය උල්ලංඝණය කලහොත් පමණි. එය නීති සිද්ධාන්තයයි. ත්‍රස්තවාදීන් මර්ධනය කිරිම වරදක් ලෙස ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල් පිලිගන්නේ නම් එම රටවලට එවන් උවදුරකට මුහුණ පාන්නට සිදුවහොත් ඔවුන් ක්‍රියා කරන්නේ කෙසේද යන්න දැනගත යුතුය. ලෝකයම සියතට ගැනීමේ චේතනාවේන් කැසකැවෙන බටහිර අධිරාජ්‍යවාදීන් දිනෙන් දින වෙනස් කරන නීති හා සම්මුති පිලිනොගන්නේය යන මතයේ පිහිටා යුද අධිකරණය හරහා දේශය ඒකාලෝක කර උදාර රණවිරුවන්ට දඩුවම් කිරිමට ප්‍රයත්න දැරීම පවා අසාධාරණ මෙන්ම අයුක්ති සහගත වෙයි. එය මහපොලව නුහුලන අපරාධයකි. මේ අනුව අන්තර් ජාතික මානුෂික නිතිය හා මානව හිමිකම් උල්ලංඝනය කරනුයේ ඇමරිකාව ප්‍රමුඛ එක්සත් ජාතින්ගේ සංවිධානයයි. ලංකාව නොවෙයි. ලංකාව රෝම ව්‍යවස්ථාවට වගකියන රටක් නොවන බව ද මෙහිදි අවධාරණය කරන්නෙමු.
යමක් සදහන් කළ යුතුය. ත්‍රස්තවාදීන් මර්ධනය කිරිමේ කාර්යාලයෙන් බැහැරව යමක් සිදුවී ද යන්න වග සොයා බැලිය යතුය. අවශ්‍යතාවය එයයි. ස්ත්‍රී දූෂණ, හොරකම්, මංකොල්ලකෑම් හා පෞද්ගලික පලිගැනිම් සිදුවී ද යන්න විමර්ශනය කර ඒ සදහා අවශ්‍ය පියවර ගැනීම කල යුත්තකි. එදා එක්සත් ජාතින්ගේ මහ ලේකම් බෑන්කි මූන් ලංකාවට පැමිණ කල ඉල්ලිම ද එයයි. ඒ අනුව හිටපු ජනාධිපති එල්.එල්.ආර්.සී කොමිෂන් සභාව හා මැක්ස්වෙල් පරණගම කොමිෂන් සභාව ස්ථාපිත කරමින් යුක්තිය ඉෂ්ඨ කලහ. එය ප්‍රමාණවත්ය. ජාත්‍යන්තර හයිබ්‍රිඩ් අධිකරණ අවශ්‍ය නැත. අප්‍රමාන අභූත චෝදනා, අසත්‍ය හා ද්වේශ සහගත වාර්තා සැලකිල්ලට නොගෙන චෝදනා සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කර අවශ්‍ය පියවර ගන්නේ නම් ඊට විරුද්ධ නොවෙමු.

**මාධ්‍යවේදී වෙලින්ටන් කහදවලආරච්චි**



# මෙහෙම ගියොත් රටම නසී මඟ සිටියොත් තෝත් නසී

අසාමාන ලක්ෂණයක් කාලගුණයේ මතුවෙමින් තිබේ. එය මතුවීමට පටන් ගැනුනේ මහින්ද හිටපු ජනපතිගේ අවසාන කාලයේ සිටය. එක දිගට ඇද හැලෙන වර්ෂාවත් සමඟ මුළු රටම කීප වරක් සෝදා යමින් තිබේ. රජය මාරුවූ දා සිට කලුවර වලාවන්, කැරකෙන වැහි කෝඩය, හෙන පිපිරුම් හා එක දිගට ඇද හැලෙන ධාරානිපාත වර්ෂාව නොනැවතී පවතී. එය ව්‍යසනයක පෙරනිමිත්තක් ලෙසද පෙනෙන්නට තිබේ. මෙවර ඊසාන දිග මෝසමේ ප්‍රචණ්ඩත්වය වෙනදාට වඩා වැඩිය. උතුරු නැගෙන හා උතුරු මැද පලාතටත් දකුනු පලාතේ ප්‍රදේශවලටත් ගංවතුර සමඟම අනාථයින්ගේ ප්‍රශ්ණයද මතු වෙමින් තිබේ. දේශපාලන බිමේදී හැඩගැසීම් වේගවත්ව සිදු වෙමින් තිබේ. ප්‍රචණ්ඩත්වය පෙන්නුම් කලේ පොලිසිය සිසුන්ට පහර දීමෙනි. අනාථයින් පෙනුනේ සිරිගෙවල්වල කොටු වූ උතුරේ බෙදුම්වාදීන්ගෙන්ය. ආර්ථිකය කලුවලාවකි. අමාත්‍ය මණ්ඩලයේ හෙණ පිපුරුම්ය. පොදු ජනතාව දැස් යොමා බලා සිටින්නේ ආණ්ඩුව දෝරේ ගලාගෙන බිඳවැටෙන දිසාවන්ය.



## සිසු සටනේ ජයග්‍රහනය

වසර ගණනාවක් තිස්සේ උසස් අධ්‍යාපන අමාත්‍යංශයත්, රාජ්‍ය පරිපාලනයත්, අමාත්‍ය මණ්ඩලයත් අතර වොලිබෝල් තරඟයක් වෙමින් තිබූ උසස් තාක්ෂණ ඩිප්ලෝමා ගණකාධිකාරී සිසුන්ගේ ප්‍රශ්ණය නිරාකරණය කෙරෙන චක්‍රලේඛය නිකුත් වී තිබේ. ඒ දක්වා සිසුන් විසින් අප්‍රතිහතව ගෙන ගිය නොමැකෙන අරගලය පූට්ටු ආන්ඩුවේ මුට්ටු කඩාගෙන ඉදිරියට ඇදී ඒමේ ලක්ෂණය පෙන්වයි. රාජ්‍ය නිලධාරි තන්ත්‍රය එයට මුහුණ දුන්නේ පොලිසියේ මෘග ප්‍රහාර දියත් කරමිනි. නිදහස් අධ්‍යාපනය පමණක් නොව ජනතාවට පාරට පැමිණ සාමකාමීව උද්ඝෝෂණය කිරීමට ඇති ව්‍යවස්ථාපිත අයිතිය රැකදීම සඳහා සිසු ප්‍රහාරයෙන් පසුව ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සිට ඇරඹූ පාගමනට එක්වූ 15000ක පමණ සිසු බලකායක් ඇස්වාට්ටුව පාරවසා වාඩිලා ගෙන පැය හතරක ප්‍රතිචාර දැක්වූයේ රජය ප්‍රජාන්ත්‍රවාදී මාවතේ ගමන් කරනවාද? නැත්නම් වීදී අරගලවලට සූදානම්වීමේ කාලවකවානුව නියමවීදැයි දැන ගැනීමට සූදානම් වන ආකාරයෙන්ය.

## ආර්ථිකය බිඳවැටී රුපියල කඩා වැටීම

මහින්ද රජයේ ආර්ථික පිලිවෙත ගැන බොහෝ දෝෂාරෝපනය කළ අය දැන් උඩ බිම බලමින් සිටිති. කෑවා කෑවා කියමින් රටම දෙවනත් කළ කොල අලියන්, රතු අලි පැටව් හා නව ලිබරල් ඊනියා බුද්ධිමතුන් ඉන්ධන සහනය බුක්ති විඳිමින් ලිප උඩ හැලියේ නටමින් විනෝදයෙන් නැටූ කාලය අවසන්ය. මොවුන් හැමට පොදු ජනතාවගේ ගිණි රශ්මිය දැනෙන්ට පටන් ගෙන තිබේ. සීඝ්‍රයෙන් ආර්ථිකය බිඳ වැටීම ආරම්භ වී ඇති අතර, හතර අතින් වැඩි පොලියට ණයට ගණිමින් රට උගස් කරමින් ඇත. නිෂ්පාදන ආර්ථිකය බිඳ වැටෙමින් තිබේ. නිෂ්පාදන සඳහා නිසි මිලක් ලබා ගත නොහැකිව තේ, රබර්, වී, සුළු අපනයනකරුවන් එක පොදියට රටපුරා ධාරානිපාත වර්ෂාවද නොතකා උද්ඝෝෂණ කරමින් සිටිති. ආර්ථික වර්ධන වේගය අඩු වෙමින් රුපියල සීඝ්‍රයෙන් කඩාවැටීම ආරම්භ වී ඇති නිසා රජයේ සේවකයින්ට ලබා දුන් වැටුප් වැඩිවීම් අතීසාරයට ගැසූ අමුඩයක් මෙන්වී තිබේ.

## රනිල්ගේ දවල් සිහිනය හා ජනතාවගේ අඳුරු රාත්‍රිය

වර්ෂාවට පෙර හඬතලන හැළ මැඬියෙකු මෙන් අගමැති රනිල් එකවර පාර්ලිමේන්තුවේදී තමන් දුටු දවල් සිහිනය ප්‍රකාශයට පත් කලේය. එය ජනාධිපතිගේ අනුමැතිය ගත් ලියවිල්ලක් නොවූ අතර මුදල් ඇමති හෑල්ලුවට ලක්කිරීම ගැන තුෂ්නිම්භූත වූ ආකාරයක් එය ඉදිරිපත් කිරීමේදී පෙනෙන්නට විය. 1977 නව ලිබරල් ආර්ථිකය රටට නිර්ධය ලෙස හඳුන්වාදුන් පරම්පරා තුලක කථාවක් බව විස්තර කලේය. ජේ.ආර්., ප්‍රේමදාස, හා රනිල් එම චින්තනය ක්‍රියාත්මක කරන සිහින මාලිගයේ නිර්මානකරුවන් බව විස්තර කරමින් තමන්ම තළුමැරුවේය. පසුගිය 20 වසර තිස්සේ රනිල් එම සැලසුම ක්‍රියාත්ම කිරීමට බලාපොරොත්තු තබාගෙන සිටියත් ජනතාව 20 වසරක් තිස්සේ එයට අනුමැතියක් දුන්නේ නැති බව ඔහුට අමතකය.

## අඳුරු රාත්‍රියේ ජනතාව අවදියෙන්

පොදු ජනතාව එකාවන්ව පෙල ගැසෙමින් බටහිර ගැති ප්‍රතිපත්තිය පරාජය කිරීමට ජේ.ආර්., ප්‍රේමදාස යුගයේදී මෙන් මෙවරත් නැගී සිට සටන් කිරීම හැර වෙනත් මාවතක් ඉතිරිවී නොමැත. එය පොදු ජනතාවට අඳුරු රාත්‍රියක් වුවත් නිදා සිටියහොත් නව ලිබරල් මංකොල්ලකරුවන් දේපොල පමණක් නොව දූදරුවන් හා ජන ජීවිතය වනසා දැමීමට අඳුරේ අත පොවන බව හොඳින් දන්නා බැවිනි.

## ඒකාබද්ධ විපක්ෂ අභියෝගය.

දැනනටමත් ඒකාබද්ධ විපක්ෂය රනිල්ගේ දවල් සිහිනයට අභියෝග කරමින් තිබේ. අර්ථසාධක අරමුදල කොල්ලකෑමට විරුද්ධව වැඩකරන ජනතාව සමඟ පාරට බැසීමට සූදානම් වේ. දැනටමත් රැස්වීම් කීපයක් පවත්වා, කම්කරු ජනතාවට කරුණු දක්වමින් උද්ඝෝෂණය ආරම්භ කිරීමට දින වකවානු යොදා ගෙන ඇත. ඉදිරි පළාත් පාලන මැතිවරණයේදී මෛත්‍රී-රනිල් පූට්ටුවට එරෙහිව පොදු ලකුණකින් ජනතාව ඉදිරියට පැමිණීම ගැන ප්‍රකාශ නිකුත් වෙමින් තිබේ. ඇමරිකානු-ශ්‍රී ලංකා රට පාවාදීමේ ගිවිසුමට අනුමැතියක් නොදීමට ශ්‍රීල.නි.ප.යේ මනස සැකසෙමින් සිටී. ඒකාබද්ධ විපක්ෂය නිලතල සකසා ගනිමින් නව විපක්ෂ සන්ධානය ලෙස පාර්ලිමේන්තුව ඇතුලතත්, පිටතත් ඒකාබද්ධ වෙමින් ඇත. දැනට එහෙ මෙහෙ පැද්දෙමින් දෙපැත්තට අදිමින් ගමන් කරන එලහරක් මීහරක් ආණ්ඩුව ගාරාදි බිඳි බොස්ගෙඩිය බිම ඇනී එලහරකා ගොඩටත්, මීහරකා මඩටත් කඩාගෙන පනිමින් ගැල්කරුද ගැලටම යටවීමේ බේදවාචකයක ලක්ෂණ පෙනෙන්නට තිබේ.

## සිරිසේනගේ පහනින් එලිය බැලීම

මෙවර රනිල්ට ඉඩක් ලැබුනේ සිරිසේන මහතාගේ පරණ පිනෙන්ය. අනුන්ගේ පහනින් එලිය බලමින් දේශීය සම්පත් කොල්ල කෑමට අතපත ගාන රනිල්ගේ දවල් සිහිනය ජනතාව පිලිගන්නේ අඳුරු රාත්‍රියක් ලෙස බව පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව සහෝදරයා දැනටමත් ජනතාවට අනතුරු අඟවා තිබේ. අඳුරු රාත්‍රියේදී බොහෝ දේ සිදු වේ. ඒවා හෙලිවන විට සිහින දැකපු අයවත් නැත. ජනතා කෝපය ඔස්සේ ජේ.ආර්., ප්‍රේමදාස අවසන් වූයේ එලසය. මෙම ප්‍රකාශයෙන් රනිල්ගේ ආණ්ඩු පාලනයේ අවසානය ගැන කල්වෙලා ඇතිව දින වකවානු හදා ගැනීමට ජනතාවට අවස්ථාවක් උදාකරදී තිබේ. රනිල් අගමැති බලාපොරොත්තු වන්නේ නව ලිබරල් ආර්ථික මාවත පූර්ණ කිරීමටය. ඒ සඳහා ඉඩම් වෙළඳපොලේ විකිනීයාමට සැලැස්විය යුතුය. ඒ සඳහා ඔප්පු ලබා දෙයි. රාජ්‍ය සේවය තමසෙක් කර කොම්පැනිවලට පවරයි. නිදහස් අධ්‍යාපනය නඩත්තුව ජනතාවට පවරා පුද්ගලික අධ්‍යාපනය ව්‍යාප්ත කරයි. මුදල් හදල් තිබෙන අයට උපාධි ලබාදී කළමනාකරන මට්ටමේ රැකියා ඔවුන්ට ලබාදී පොදු ජන උගතුන් බිහිවීම වනසයි. නිදහස් සෞඛ්‍ය සේවාව ක්‍රමයෙන් මුදල් අයකර නඩත්තු කරන ආකාරයට පරිවර්තනය කරයි. කම්කරුවන්ගේ වැඩිහිටි ආරක්ෂාව සඳහා බණ්ඩාරනායක රජය කාලයේදී ඉලංගරත්න අමාත්‍යවරයා විසින් ඇති කළ අතිවිශාල අර්ථසාධක අරමුදල මහ බැංකු පාලනයෙන් ඉවත් කර කොම්පැනිකරුවන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතාවයට යෙදවීම ගැන කියයි. මේවා සියල්ල දවල් සිහින වන්නේ නව ලිබරල් ආර්ථික ක්‍රියාපිලිවෙල ලෝක වශයෙන්ම බිඳ වැටෙන යුගයක හුලං පිඹීමට රනිල් සැරසෙන නිසාය. ජේ.ආර්.ගේ වකවානුවේදී එය ලෝක ක්‍රමයක් ලෙස ජනප්‍රියත්වයක් පැවතුනි. ප්‍රේමදාස ගතකලේ අර්බුදය තියුවූ යුගයකය. ඔහු විශාලා මහා නුවරක් නිර්මානය කර මහ පාරේ අස්වාභාවික අභාවයකට අවාසනාවන්ත ලෙස ගොදුරුවිය.රනිල් ඒ දිනවල වධකයෙකු වූ බව රටම දනී.

## රටත් නැතිකර ඇසක් නැතිකර ගැනීම

චන්ද්‍රිකා විසින් නව ලිබරල්වාදයට මානුෂික මුහුණුවරක් පෙන්වන්නට ගොස් රටත් නැතිකර ඇසකුත් නැතිකර ගෙන ජීවිතය ගලවා ගත්තේ අනු නමයෙනි. එනිසා මේ වන විට පොදු ජනතාවත්, ලෝකයත් නව ලිබරල්වාදයට වඩා බොහෝ දුරක් ඉදිරියට ගොස්ය. චීනයට ඉන්දියාවට නියවූ රනිල්ගේ ගෝලබාලයෝ අද වන විට නැවතත් එම රටවල් වටේ කැරකෙමින් සිටින්නේ බටහිරින් මුදල් නොව ලැබෙන්නේ ආයුධ, උපදෙස් හා උඩගෙඩි පමණක් වන නිසාය. බටහිර නව ලිබරල් ස්වාමිවරුන්ට ඔවුන්ගේ රටවල ප්‍රශ්ණ විසඳා ගත නොහැකිව වෙනත් රටවල්වල සම්පත් කොල්ල කමින් සිටින යුගයක ඔවුන්ගේ උපදෙස් ලැබෙන්නේ අපගේ ජනතා සම්පත් කොල්ල කෑමටය. රනිල් ඔවුන්ගේ ඒජන්තයෙක් ලෙස දවල් සිහින දකින්නේ ඒ සඳහාය.

## මෛත්‍රීපාල ජනපති දෙලොවක් අතර

වර්තමාන ආණ්ඩුවේ පරමාධිපත්‍ය බලය පවතින මෛත්‍රී විසින් ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු වුවත් බල්ලාගේ වැඩේ බූරුවා බාරගත් බව රනිල්ගේ දවල් සිහිනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පෙනී යයි. තමසෙක් ගැන මෛත්‍රීපාල මහතා කථා කලත් අර්ථසාධකය අරමුදල යොදා බහුජාතික සමාගම්වල පුද්ගලික අංශයේ ප්‍රාග්ධනය සඳහා එය යොදා ගැනීමට එකඟද? නිදහස් අධ්‍යාපනය වැනසීමට නොහැකි බව සිසු අරගලයේ පාඩමින් මෛත්‍රීපාල ජනපති තීරණය කල බව කාටත් පෙනේ. නාවික හමුදාවෙන් බැහැරට ගෙන පුද්ගලික අංශයට පැවරූ ඇවන්ගාඩ් ආරක්ෂාව නැවත රජයට පවරා ගැනීම මෛත්‍රීගේ උවමනාව අමාත්‍යවරුන්ගේ හඬින් පිටවීමකි. රනිල්, මාරපන, විජේදාසට එරෙහිව අමාත්‍ය මණ්ඩලය විරෝධයක් පමණක් නොව යූ.ඇන්.පි.ය ඇතුලත විරෝධයක් ලෙස එලිබැස තිබේ. ආර්ථිකය බිඳවැටී රුපියල කඩාවැටීම ගැන හිටපු මුදල් ලේකම් කැඳවා උපදෙස් ගෙන තිබේ. රනිල් බටහිරට දුවන අතර මෛත්‍රී චීනය හා ඉන්දියාව සමඟ සම්බන්ධය නැවත ගොඩනඟා ගනිමින් තිබේ. නිමල් සිරිපාල ශ්‍රී ල.නි.ප. ජ්‍යෙෂ්ඨ උපසභාපති මානව හිමිකම් කුමාරයාගේ ප්‍රතිගාමී ගිවිසුමට අත්සන් කිරීමට එරෙහිවත්, යහපාලනය අවසන් වී ඇති බවත් එලිපිට ප්‍රකාශ කරමින් සිටින්නේ මෛත්‍රීපාල නොදැන නොවේ. මෙයින් පෙන්නුම් කරන්නේ අයවැයත් සමඟ පැමිණෙන ජනතා බර ඉදිරියේ පූට්ටුවේ මූට්ටු කඩාගෙන මෛත්‍රීපාල ජනපතිට ඉදිරියට ගමන් කිරීමට සිදුවන්නේ මෙහෙම ගියොත් රටම නසී මඟ සිටියොත් තෝව නසී යන හඬ අමාත්‍ය මණ්ඩලය තුලත් ශ්‍රී ල.නි.ප.තුලිනුත් මතු වෙමින් තාවකාලික විසඳුමක් සෙවීමය. එහිදී යූ.ඇන්.පී. නොවන ආණ්ඩුවක් හැදීම පිලිබඳ අදහස ආණ්ඩුවෙන් පිටතට කාන්දුවී වේගයෙන් ජනතාව අතරට ගමන් කරනු ඇත.

**සිරිසුමන විදානපතිරන**
**2015-11-17**

# නිෂ්පාදන විකුණ ගන්න බෑ බඩු මිල දරා ගන්න බෑ



**අමිල මැතිතුමා**

**ඇඹිලිපිටිය ප්‍රාදේශිය සභාවේ හිටපු සභාපති**

මේ දිනවල ගොවින්කරන්නේ කුඹුරුවල මඩ වැඩය. දැනට නම් බිත්තර වී ප්‍රශ්නයක් නැත. තෙල් බෙහෙත් මිල වැඩිවීමට ඉඩ තිබේ. පොහොරටික වෙනදා වගේ ලැබුණහොත් වී අලෙවිකර ගැනීමේ දී රජය හරියට මැදිහත් උනොත් වෙළඳපොලේ සාධාරණ මිලක් ලබා ගන්නට පුළුවන් විය හැක.



**ලක්මාලි සෙනෙවිරත්න - කලවාන.**

තේ අක්කර 1 1/2 පමණාතේ දළු 1 කින් රුපියලකවත් ආදායමක්නැත. වැඩක් නැති නිසා කප්පාදු කලා. දළු කඩන කුඩාකොටසක් ඇත. ගියවර කැඩූ දළුවලින් ද ගෝනි3 ක් දමා ගියා. දළු ප්‍රමිතියට නැති කියා. කප්පාදුවෙන්මාස6 ක් විතරයනවා. නැවත දළු කඩන්න. ඒ වෙනකොට මිල හරියයි හිතා ගෙන ඉන්නවා. ඉතුරු කරගෙන තිබු මුදලින් යන්තම් පිරිමසා ගන්නවා. රනිල් මයාගේ හා මෛත්‍රි මයාගේ අම්මලා ගැන මිනිසුන් නිතර මතක් කරනවා.



**ආර්. විශ්වලිංගම් - වව්නියාව**

මුලතිව් අකක්ර 500 ක් ලොකු මුස්ලිම් මුදලාලිලාට බෙදුවා. තිබුණු ගස්කපා ඇත. ඒවාට වුනුදෙයක් නැත. ඒවා අයිතව තිබුනේ වනසංරක්ෂණයටය. මේ අතර මුලතිව් වගාකිරීමට ඉඩම් නැති මිනිසුන් සිටී.

**සිරිමල් - ජනතා සෞඛ්‍ය සංසදයේ ලේකම්**



ඖෂධ පණාතේ ප්‍රථිඵලයක් නැත. බලාපොරොත්තු උනේබෙහෙත් මිල අඩුවීමකි. ඖෂධ නියාමන කොමිෂම පත් කරලා දනැත. රෝගීන් වෙනුවෙන් අනුකොමිටි යටපත් කල හැකි අය ලෙස සංසදය විසින් නම් කල වෛද්‍යවරයෙකි. ඔවුවපත් කරනලා දනැත. රුපියලේ වටිනාකම අඩුවීමත් සමග තත්වයවඩාත් බරපතලය. නියාමන කොමිෂමට සාමාජිකයන් වහාම පත් කල යුතුය.



**එම්. මරික්කාර් - කෑගල්ල**

කෝපි, ගම්මිරිස්, සාදික්කාකරාබු ආදි සුළු අපනයන භෝගවල එලදාව අඩුවීමක් සම මිල පහල වැටීමක්සිදු වී තිබේ. මේ නිසා සුළු වගාකරුවන්ගේ ආදායම පහල වැටී ඇත. තවද සුළු ව්‍යාපාරිකයන්ගේ වෙළදාමේ අඩුවීමක් ද යෙදවන මුදල අනුව ප්‍රමාණවත් ලාභයක් නැතිකම ද ඔවුන්ගේ දුක්ගැන විල්ලය. මහවෙළදුන්තොග රැස්කරමින් අයුතු ලාභ ලබන බව ද ඔවුන් කියයි. මේ පිලිබදව රජයේ කිසිම මැදිහත් වීමක් නැත.



**අනුර පොල්ගහවත්ත - අගලවත්ත.**

කුඩාතේ රබර් කට්ටි කරුවන් රබර් කපන්නේම නැත. තමන් කපා ගන්නවා හැර කුලියට මිනිසුන් ගෙන රබර් කපන්නේ නැත. මිනිසුන් හැමෝම හඩා වැටුනු ගමන්ය. එහේ සමුහයකින් ක්‍රියාකිරීමක් නැත. ඉදිරියේදී පැමිණිලි කිරීමට ඔවුන් මන්ත්‍රීවරුන්ගේ ගෙවල්වලට යනවා ඇත. ඒ අතර ඉදිරි පළාත් පාලන මැතිවරණයේ දී සිදු කළ යුතු වෙනස ගැනද කථා කරමින් සිටී.

**අසිපත**

මිල පහලට වැටුනු තේ ටි
වෙහෙසන පතල් කම්කරු
සම්මුති වාදයේ හෙංචයිය
කො දැන් බොලව් දෙනවා

වැඩි වන සියලු බඩුවල මි
ජීවන බරට සරිලන ලෙස
පාවා නොදී රට ජාතික ර
නැත්නම් අස්වෙයන් බැරි

නැති කර දමන්නට ඇති
ලැබ ගෙන තිබෙන මහජ
කනපිට හරවන් දැන් පෙ
දැහට නොපෙනියන් නො

ගිවිසුම් කන්ද උඩරට මෙ
අටසිය පහලොවේදී එය
හතලිස් අටේ ලැබු නිදහ
යම පාලනෙන් සැලසේ පා

**ඇහැළියගොඩ සේන**

## පාර්ලිමේන්තු
සභා ගැබෙන්

වී, තේ සහ රබර් සඳහා සහතික මිල නොගෙවීම පිලිබඳව, පැවති විවාදයේදී වාසුසහෝදරයා කල කථාව
2015.10.07
මීලඟට ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රිතුමා, ඔබතුමාට විනාඩි4 ක කාලයක් තිබෙනවා.
ඔව්.
එහෙනම් ඉතිං කථා කරන්න පටන් ගන්නවත් බැහැනේ. දිනේෂ් ගුණවර්ධන මැතිතුමනි, මට දීලා තිබෙන්නේ විනාඩි4 ක කාලයක්නේ.
මම නොවෙයි වේලාව වෙන් කරන්නේ (බාධාකිරීම්)
මුලාසනයෙන් නොවෙයි (බාධාකිරීම්) මේකට කුමක් හෝ විසදුමක් තිබෙන්නට ඕනෑනේ (බාධා කිරීම්)
හොඳයි මම කථා කරන්නම්. නමුත් මට සමාවන්න ඕනෑ ඔබතුමියගේ නියමය නොකතා කථා කරන්නට වුනොත්, මම ඉතා කෙටියෙන් කථා කරන්නම්.
හාල් වෙනුවට පිටි කෑමෙන් සිදුවුන අර්බුදයයි මේ තිබෙන්නේ. අපි මේ සඳහා කල යුත්තේ පිටි කෑම නවත්වලා හාල් පරිභෝජනය වැඩි කිරීමයි. දැන් ඉන්දියා වේ දළදේශිය නිෂ්පාදිතයෙන් සියයට එකක් ආහාර සුරක්ෂිතතාවය සඳහා වෙන් කරනවා. මොකද්ද කරන්නේ? එරට Food Corporation එකෙන් ධාන්‍ය මිලදී ගන්නවා. ධාන්‍ය මිලදී අරගෙන දුප්පතුන්ට කිලෝ ග්‍රෑම් 45 ගණනෙත්, දුපත්නොවන අයට කිලෝ ග්‍රෑම් 35 ගණනෙත් සහන මිලකට බෙදා හරිනවා. එතකොට එක පැත්තකින් නිෂ්පාදනය වෙනවා, ඒවා ප්‍රසම්පාදනය වෙනවා. ඊලඟට රජයෙන් ඒවා සහන මිලට දුප්පතුන් අතර බෙදා හරිනවා. ඒ නිසා ඒ රටේ කෘෂිකර්මයේ අර්බුදයක් නැහැ. අපේ රටෙත් එහෙම තිබුණා. නමුත් ඒ ක්‍රම එදා යූඑන්පී ආණ්ඩුව නැවැත්වුවා. මේ රටේ සලාක කඩ ක්‍රමය තිබුණා. ඒ ක්‍රමය උඩ තමයි මේක යන්නේ.
මට තිබෙන ඉතිරි විනාඩි3 තුල මම අනෙක් කාරණය ගැන සඳහන් කරන්න ඕනෑ. ඇත්තටම ලෝකයේ ඕනෑම රටක පාන් ගෙඩියක මිල රුපියල් 400යි. මෙහේ Bread Talk එකට ගියාම එතැන පාන්ගෙඩියක් රුපියල් 400යි. අපට රුපියල් 50 ට දෙන්නේ මොනවාද? රොඩ්ඩ. හරියට පොල්මිරිකලා විසිකරන පොල්කුඩු වගේ ටික තමයි යම් සහනයක් වෙන ආකාරයට පාන්පිටි මිල අඩුකරලා සලාක ක්‍රමයකට හෝ යම් නියමිත ප්‍රමාණයකට බෙදා හරින්න ඕනෑ. විශේෂයෙන්ම වතු කම්කරුවන්ට බෙදාහරින්නට ඕනෑ. ඒක වෙනම කාරණයක්. ඒ අයට විතරක් සීමාවූ ක්‍රමයක් ඇති කරන්නට ඕනෑ. අපි අනෙක් අයට හාල්පිටි කෑමට පුරුදු කරන්න ඕනෑ. හාල්පිටි වලින් පාන් හදනවානේ. ජපානයේ හාල් පිටිවලින් පාන් හදනවා. ආරියශිල වික්‍රමනායක මහත්මයා හාල්පිටිවලින් හැදුපාන් මෙහේ ගෙනැල්ලා පෙන්වුවා. මයික්‍රෝන් 60 ට හාල්කොටනවා නම් පාන්හදන්න පුළුවන් කියලා කියනවා. මේ තාක්ෂණය ගේනනයි තිබෙන්නේ.
තාක්ෂණය ප්‍රශ්න ගැන බීජ ගැන අස්වනු ගැන පසු අස්වනු ගැනඅනුර කුමාර දිසානායක මන්ත්‍රිතුමා හුගාක් කථා කලා. එතුමා කථා කල යුත්තේ සමාජ ප්‍රශ්නය ගැන. මේ අතර මැදියන් නිසා වේලා තිබෙන්නාවුඅමාරුව ගැන.
දැන් බලන්න වී සමාගම්කාරයෝ, හාල් සමාගම් කාරයෝ සුළු කාලයක් ඇතුලත කොච්චර පොහොසත් වෙලා දකියලා. ගොවින් එම ප්‍රමාණයට තමන්ගේ ආදායම්වල දියුණුවක් ලැබුවේ නැද්ද? මෙන්ම මේ දෙක සංසන්දනය කරලා බැලිය යුතුයි. වී මෙච්චර මිල දී ගත්තා. අච්චර මිලදී ගත්තා කියන්න එපා. වෙළඳ පොලේ වී වල මිල කීයද? රුපියල් 25 නම් එකෙන් කියන්නේ ඒ ගත්ත එක වෙළඳපොලට දැනිලා නැහැකියන එකයි. අපේ ආණ්ඩුව කාලයේ වී කිලෝ එකක මිල වෙළඳ රුපියල් 35 ට ගියා. ආණ්ඩුව වී කිලෝ එක රුපියල් 30 ට වික්කා. ආණ්ඩුව ඔක්කෝම ගත්තේ නැහැ. නමුත් ඒ මිල දී ගැනීමේ අර්ථය වෙන්නේ වෙළඳ පොලේ මිල යම් තැනක රැඳවීමයි. එහෙම බැලූවාම අද වී කිලෝව තිබෙන්නේ රුපියල් 25ටයි. ඒ අනුව අද එක ලයිෆ්බෝයි සබන් කැල්ලක් ගන්න වී කිලෝ2 ක් විකුණන්න ඕනෑ. මෙන්න හුවමාරුවෙන ආකාරය.
දැන් ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රිතුමා

දකින්නේ හැම නිෂ්පාදකය
ගන්න පුළුවන්, වී නිෂ්පාදක
නැහැ. එහෙම නොවෙයි
මෙහෙවන්න ධනවත් කොම්
තිබෙනවා. මිල තීන්දු ක
ව්‍යනිපදවන කිසිවෙකුට මි
ඒක කෙසෙල් වගාකරන
වගාකරන ගොවියාටත් බැ
ප්‍රාථමික භාණ්ඩ වෙළඳ
ප්‍රශ්නයක්. ඒ වගේම
ප්‍රශ්නයක්. ඒ නිසා ර
පැහැදිලිවම අපි ස
වෙළඳපොලේ යම් මිල
එයකරන්න පුලූවන්. අපි
වලික් කොටසක් මේ රටේ
මිලකට බෙදා දීලා කැල
නම්හොදයි. කීයදඅපේක
ජාතික කැලරි මට්ටම්
පුරුෂයින්ට කැලරි මට්ටම
කාන්තාවන්ගේ කැලරි මට්ට
මේ කථා කරන අපේ ර
මට්ටම? මුලාසනා රූඪ ගර
මේ ප්‍රශ්නය දෙස සමාජ ක
මේ ප්‍රශ්නය දිහා සමාජ
අපට වඩා හොද අලෝකයක
දැන් ඔබතුමාගේ කථාව
මන්ත්‍රිතුමනි.



**රාජු බාස්කරන් - වතු කම්කරු අංශය**

ඡන්ද පොරාන්දුවවත් තෙන්දිනකට රුපියල්1000 ගෙවන ගණනට ඉතුරු මුදල ආණ්ඩුවෙන් ගෙවන බව කිව්වා. යූ.එන්.පී ය කිව්වා 1000 ගෙවනවා කියා. දැන් අලියා සහ බුලත් කොලය දෙකම ආණ්ඩුවේ. ඒ නිසා මෙය ගෙවිය යුතුයි.වෙන යෝජනාවලින් වැඩක් නැත. සුභසාධන නියමිත ලෙස නැහැ. වතුවල ත්‍රිපෝෂවත් හරියාකාරව ලැබෙන්නේ නැහැ.

**ආර්.එස්. නානායක්කාර -අනුරාධපුරය.**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ මේ වන විට ජනජීවිතය ආර්ථික වශයෙන් ආර්ථික තත්වය සීග්‍රයෙන් පහලට බැස තිබෙනවා. එයට හේතු සාධක කිහිපයක් අපටදකින්නට තිබේ. එයින් එක්කරුණක් වන්නේ ඔවුන්ගේ රැකියා ප්‍රශ්නයයි. ඔවුන් කරපු කුලී වැඩ මේ වන විට සීඝ්‍රයෙන් පහල බැස තිබෙනවා. එයටහේතුව වන්නේ කොන්ත්‍රාත් කරුවන් සඳහා කොන්ත්‍රාත් වැඩපලවල් නොමැති වීම. තවද ගොවිතැන්කරගෙන ආපුගොවින්ගේ ගොවිතැන මේ වනවිට අඩුවී ගෙනයන බවපෙනී යනවා. ඊට හේතුව වී ඇත්තේ ඔළුන්ගේ බෝග වලට ස්ථාවර මිලක් නොමැති නිසා. තවද අනුරාධපුර දිස්ත්‍රික්කයෙ ‘අභයවැව ප්‍රදේශයේ ගලා යන යෝධ ඇල නිසා ඒ අවට ප්‍රදේශයේ ගොවිතැන්කරන ගොවීන්ට ගොවැතින් කිරීමට අපහසු තවී තිබෙනවා. එයට හේතුව වන්නේයෝධ ඇල හරහා සංවර්ධනය නොකිරීම නිසාය. දෙපස තිබෙන ගොඩ ඉඩම් සහ කුඹුරු ඉඩම් යෝධ ඇල පිටාරය ගැනීම නිසා එම ඉඩම් වල ගොවිතැන් කිරීමට නොහැකි වීම. තවද මේ වන විට ජනතාවට ලබාදුන් සහනාධාර කපා හැර තිබේ. මේ සියල්ල ගත් කල මිනිසුන්ගේ ආර්ථිකය සීඝ්‍ර ලෙස පහල බැසීමක් සිදුව ඇත. මේ වනවිට වෙළඳපොලේ ඇති අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ඉහල යැම නිසා මිනිසුන්ට ගොඩක් අපහසු වී ඇත. අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල වැඩිවුව හොත් එදිනෙදා කුලි වැඩකර ජීවත් වන මිනිසුන්ගේ වැටුප වැඩි නොවීමක් මේ ජීවන බර ඉවසන්නට ඔවුන්ට නොහැකිය.

| | |
|---|---|
| ක රබර් | ටික |
| වන්ගේ මැණික් | ටික |
| ලා | ටික |
| කී සහන | ටික |
| ල පහත | දමව් |
| වැටුප් | දියව් |
| ්කල | දියව් |
| ම් ගෙදර | යමව් |
| නැති | පරතරය |
| තාවගේ | වරය |
| ්වන | තිරය |
| ුකින් හැති | කරය |
| හි ගෙන | ඒකක් |
| සිදු | වීමක් |
| වැල | ලීමක් |
| වා | දීමක් |

## නඩු අහන්න අපේ රටට සුද්දෝ එනවලූ

සිරිලංකා මව පැටලී ඉන්නේ පඹ ගාලකයි
හරි පාරට ඇදල ගන්න ඕනැවන කාලෙකයි
යමක් කමක් ඒ වෙනුවෙන් කල හැකි වන පිරිවරයි
මිනින්තුවක් රබන් පොඩිය හඩවන්නට අවසරයි

යුද්දේ දිනල රට ගෙන ගියේ දියුණුවේ හොද ගමනකයි
සද්දේ දමපු යහපාලන ප්‍රෝඩාවෙන් විරසකයි
දැලි ගාගත් යූ.එන්.පී ය ඉතිහාසයේ ඉදලමයි
පලි ගැනුමයි පාවා දීමයි අද හැම තැනකමයි

රටින් පැනපු පාතාලයෝ ආයේ රටට ගෙනල්ලා
තැන්න තැනින් මතුවන වෙඩි හඩවල් අහ ගනිල්ලා
හැම රට කම තවමත් කොටි අවසන් කලේ අප රටයි
එම අභිමාණය පාවා දෙන්නේ කැත විදියටයි

- මුරුංගාගස්යායේ සුරිය දිසානායක -

...ටම මේ ගැටලූව විසදා ...යාට විතරයි බැරි කියලා. ... කාර්මික නිෂ්පාදනය ...පැනිවටල පුළුවන්කමක් ...රන්න. නමුත් ප්‍රාථමිකද්‍ර ...ල තින්දු කරන්න බැහැ. ... ගොවියාටත් බැහැ. වී ...හැ. ඒ නිසාමේ තිබෙන්නේ ...පොලටගෙනයාම පිලිබඳ ...මේ තිබෙන්නේ සමාජ ...ජයේමැදිහත් වීම තුල ...තික කරන්න ඕන. ...මට්ටමක් පවතින බව. ...සම්පාදනය කරන ඒ වී ...ජනතාව අතර අඩු සහන ... මට්ටම වැඩි කරනවා ...ැලරිමට්ටම. සාමාන්‍ය ...2100යි. සාමාන්‍යයෙන් ... 2500 ක් තිබිය යුතුයි. ...ම1500යි. ඉතිං මොකක්ද ...ටේ තිබෙන ඉහල ජීවන ... මන්ත්‍රිතුමනි, අපේ රටේ ...ෝණයකින් බලන්න ඕනෑ. ...කෝණයකින් බැලූවොත් ...් ලැබෙයි. ... අවසන් කරන්න ගරු

මගේ කථාව දැන් අවසන් කරන්න කියලා ඔබතුමිය කියන්නයන බව මම දැන ගත්තා
තේ දළු වල මිල මේ ගණනට පහත දැම්මොත්, මේ රබර්වල මිල මේ ගණනට තිබුනොත් මොකද වෙන්නේ? මට හමුවුනා අද එක්සත් ජාතික පක්ෂයේ නායකයෙක් මේ තත්වය මත මුළු රටම ගිනිගනියි, ගිණි ගන්නවා විතරක් නොවෙයි ආණ්ඩුවත් ගිණිඅවිලෙයි කියලා මම කිව්වාම එතුමාඒක පිලිගත්තා. ඒකමතක තියා ගන්න ඕනෑ. තේ පිලිබඳ ප්‍රශ්නය ගැනමම දිගටම කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඇමතිතුමා හමුවෙලා මම කියන්න ඕනෑ. මේ තේ වලට දෙන සහනය හරියාකාරව බෙදෙන්නේ නැහැ කියලා.
අපේ ප්‍රධාන අපනයනතේ, පොල්, රබර් වන තාක්කල් ඒවායේ මිල අපට තීන්දුකරන්නබැහැ. ඒක තින්දු කරන්නේ ලෝක වෙළඳ පොලෙන් තමයි. කාලගුණ තත්වය, යුද්ධ, ඩොලරයේ අවප්‍රමාණවීම යන මේවාත් ඒකක් වෙළඳපොල කඩාවැටෙන්නට ඉඩකඩ තිබෙනවා. මීට කලින් අපි ඒවා පෙන්වලා දුන්නා. නමුත් ඒවා කියලා අත පිහදාගන්න ආණ්ඩුවට අයිතියක් නැහැ. ලෝක වෙළඳපොලේ මිල අඩුවීම විතරක් නොවෙයි තේ නිෂ්පාදනය අඩුවීමට බලපා තිබෙන්නේ. ඒකට අපේ රටේ දැනි අපි මුහුණ දෙන තත්වයක් තිබෙනවා



# පාර්ලිමේන්තු සභා ගැබෙන්

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මෙම යෝජනාව ඉදිරිපත් කල ගරු විජිත හේරත් මන්ත්‍රිතුමා මා පළමුවෙන්ම ස්තුතිවන්ත වන්නට ඕනෑ මට කලින් කථා කල ගරු සම්පන්දන් මන්ත්‍රීතුමා කිව්වා වගේ මෙම ප්‍රශ්නය බරපතල විධියට මතු වෙන්නේ යුද්ධයේ ප්‍රථිපලයක් හැටියටයි. යුද්ධය පැවති කාලයේ අපේ ධීවරයන් නොගිය මුහුදු ප්‍රදේශයක අවුරුදු තිහක් පමණ කාලයක් තිස්සේ ධීවර කටයතු කරන්න ඉන්දියානු ධීවරයන් පුරුදු වෙලා සිටියා. යුද්ධය ඉවර වුන හැටියේම අපේ ධීවරයන්ට එම මුහුදු ප්‍රදේශයට යන්නට ඉඩ ලැබුණත්, අතර භුක්තිය පිලිබඳව තිබෙන්නා වු හිමිකම අපට තිබෙන නීතිමය හිමිකමට වඩා සැබෑ හිමිකමක් භුක්තිය හා අයිතිය අතර නම් මේ ප්‍රශ්නය තිබෙන්නේ, ඇත්තටම අවුරුදු තිහක් භුක්ති විදපු ඒ ධීවරයන්ගේ ධීවර ජිවනෝපාය අපේ අයිතිය හැටියට නැවත අපට දෙන්න කියා අපපි ඉල්ලනවා. එසේ ඉල්ලූවාට මෙතැන විසදිය යුතු ගැටලූවක් තිබෙනවා. ඒ ගැටලූව විසදා ගන්න එක නිකම්ම මේ බලය පාවිච්චි කිරීමේ ප්‍රශ්නයක් නොවෙයි. එම ධීවරයන්ගේ පැමිණීම අපි නවත්වන්නේ කොහොමද? ගරු සම්පන්දන් මන්ත්‍රිතුමාත් කියපු විදියට ජනාධිපතිතුමා අපේ නාවික හමුදාවට කියලා තිබෙනවා ඉන්දියානු ධීවරයන්ගේ පැමි□ම නවත්වන්න කියලා. ධීවර යාත්‍රා තුන් හාරසියයක් එන කොට අපි නවත්වන්නේ කොහොමද? නවත්වන්න වෙන්නේ බලය පාවිච්චි කරලයි. මොකක්ද පාවිච්චි කරන බලය ධීවර යාත්‍රා තුන් හාරසියයක් එනකොට ඒක නවත්වන්න අපිට නාවික යාත්‍රා කොච්චර වුවමනා වෙයිද? ඒ නිසා මේවා ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නැගීමේ ගැටලූ රාශියක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ගැටලූව තිබෙන්නේ ලංකාවේ විතරක් නොවෙයි. චීනයේ සහ ජපානය අතරත් මේ ආරවුල තිබෙනවා නේ. පකිස්ථානය සහ ඉන්දියාව අතර මේ ආරවුල තිබෙනවා. ගුජරාටියට ආසන්න මුහුදු ප්‍රදේශය සම්බන්ධයෙන් ඒ වගේම යුරෝපයේත් ඉස්සර මේ ආරවුල තිබුණා. දැන් ඒවා ටික ටික අඩු කර ගෙන තිබෙනවා. අපට මෙම ගැටලූ අඩු කර ගන්න පුළුවන් වන්නේ සාකච්ඡා මගින්ම විතරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ගැටලූව නිසා අපේ ධිවරයන්ගේ ජීවනෝපාය මාර්ගය නැති වෙලා තිබෙනවා මට නම් තිබෙන ලොකුම ප්‍රශ්නය එයයි. මේ අය අපේ පුරවැසියන්. මේ මිනිසුන්ගේ ජීවනෝපාය මාර්ගය නැති වෙලා තිබෙනවා නම් අපි ඒ අයට උදවු කරන්න ඕනෑ. අපේ රජයක විදේශ කටයුතු හා ආරක්ෂක කටයුතු පිලිබඳ අංශවල මේ ගැන ක්‍රියාත්මක වීමට ඉඩක් නැහැ. නොයෙකුත් රාජ්‍ය තාන්ත්‍රික හේතු නිසා එහෙම නම් ඒ මිනිසුන්ගේ ජීවනෝපාය සඳහා අපි උදව් කරන්න ඕනෑ. රජය මේ ජීවනෝපාය අහිමි වු ධීවරයන්ට උදව්වක් කරන්න ඉදිරිපත් නොවන්නේ ඇයි. මේ ධීවරයන් වෙනුවෙන් දුක කියනවා ඊල ට කියනවා ඉන්දියානු ධීවරයන් එනවා කියලා.

ඊළඟට කියනවා, අපට මේක නවත්තන්න බැහැ, රාජ්‍ය තාන්ත්‍රික ප්‍රශ්නයක් තිබෙනවා කියලා. අන්තිමට මේ දුක විඳින්නේ කවුද? අපේ ධීවරයන්. මේ ධීවරයන්ගේ ජීවනෝපාය මාර්ගයට උදව්වක් දෙන්න රජය ඉදිරිපත් වෙන්නේ නැත්තේ ඇයි? මේ ප්‍රශ්නය විසඳන තුරු රජය කළ යුත්තේ එයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර ධීවර සම්මුතීන් තිබෙනවා. ඒ සම්මුතීන්ට අනුව මුහුදු පතුල සූරා ගෙන යන ධීවර කර්මාන්ත ක්‍රමය තහනම්. ඒ ජාත්‍යන්තර සම්මුතීන්ට අතුව මේ පිළිබඳව ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළක් ඇති කරන්න ධීවර කර්මාන්තයට විශේෂ වූ ඒක්සත් ජාතීන්ගේ සංවිධානය එම අධිකාරියන් හරහා අපේ මුහුදු පතුල සූරන භයානක සාපරාධී ධීවර කර්මාන්කය තහනම් කළ යුතුයි. එය වැලැක්වීමට ජාත්‍යන්තර මෙහෙවරක් අපට අවශ්‍ය වී තිබෙනවා. ඒ ජාත්‍යන්තර මෙහෙවර අපට ඉල්ලන්නේ නැත්තේ ඇයි? ජාත්‍යන්තර මෙහෙවරක් අවශ්‍ය වන්නේ ලංකාවේ යුද්ධ ගැන විතරද? එක්සත් ජාතින්ගේ සංවිධානයේ ජාත්‍යන්තර මෙහෙවර යුද්ධයේ දී සිදු වුණු වැරදි ගැන සොයන්න විතරද? මෙය අපේ විතරක් නොවෙයි, සමස්ථ මානව සංහතියේම මුහුදු සම්පතයි. මේ විධියට මේ මුහුදු ධීවර සම්පත අපට අහිමි කිරීමේ සාපරාධි ධීවර කර්මාන්ත ක්‍රමය වැලැක්වීම ජාත්‍යන්තරයේ වගකීමක්. මෙය හුදෙක් අපේ මුහුදු සීමාවේ ප්‍රශ්නයක් ගැටලූවක් නොවෙයි. ඒක වෙනම ප්‍රශ්නයක්.
මේ සාපරාධී ධීවර කර්මාන්ත ක්‍රමය වැලැක්වීමට අපි වහාම ජාත්‍යන්තරව සමුළුවක් කැඳවා මේ පිලිබඳව කගකීම ජාත්‍යන්තර වශයෙන් භාර කල යුතුය. මෙවර තිරසර සංවර්ධන ඉලක්ක Sustainable Development Goals ;=, wfma පරිසරය රැක ගැනීමේ ඉලක්කය තිබෙනවා. එයට ප්‍රමුඛත්වය ලබා දී තිබෙනවා. මෙය පරිසරය හා ස්වභාවික සම්පත් රැක ගැනීම පිලිබඳ කාරණයක් නොවෙයි ද කියා මා රජයෙන් අහනවා. ඒ වගේම මේ යෝජනාව ඉදිරිපත් කරපු අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමාටත් මා කියන්න කැමතියි, මේ පිලිබඳව රජයේ අවධානය යොමු කර එතුමන්ලාට කල හැකි බලපෑමක් කරන්න කියලා.

ඊලඟට මුහුදු නීතිය පිලිබඳව එක්සත් ජාතින්ගේ සංවිධානයේ විශේෂ කොමිෂමක් තිබෙනවා. මේ කොමිෂම හරහා පිහිටු වූ විනිශ්චය සභා තිබෙනවා. මේ විනිශ්චය සභාවලටත් මේ කාරණය යොමු කල යුතු කියා මා හිතනවා. මුහුදු නීතියට අදාලව තිබෙන විනිශ්චය සභාවටල අපේ මේ පැමිනිල්ල අප ඉදිරිපත් කල යුතුයි. මුහුදු නීතිය පිලිබඳ කාරණය ඇත්තටම ලෝක සාමයට බලපාන කාරණයක්. මේක විසඳා ගන්නට ඒ විනිශ්චය සභා හරහා යාමට තිබෙන ඉඩකඩ අපි පාවිච්චි කල යුතුයි. එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රිතුමා කථා කරමින් කිව්වා. මේ චීන යාත්‍රාවලට ඉඩ දීපු එක තමයි වුණු ලොකුම වරද කියා.

විදේශ ධීවර යාත්‍රා පානය කිරීම, නියමනය කිරීම සඳහා අපට පනතක් තිබෙනවා. ඒ පනත අනුව කිසියම් වු විදේශ යාත්‍රාවක් ලංකාවට එනවා නම් ඒ එන්න පුළුවන් වන්නේ අවසර ගෙනයි. එහෙම අවසරයක් නැත්නම් එය අත්අඩංගුවට ගැනීමට අපට සම්පූර්ණ අයිතියක් තිබෙනවා. ඒ යාත්‍රා ඉන්දියාවෙන් එන මේ තුන් හාරසීයක් වන ධීවර යාත්‍රා වගේ නොවෙයි. ඒවා ලංකාවේ කොඩිය දමන්නේ ලංකාවේ අවසරය ලබා ගෙනයි. ඔවුන් ලංකාවට ඒකට ගෙවීමක් කරනවා. ඒ ගෙවීමට අමතරව ඔවුන් අත්පත් කර ගන්නා වු ධීවර සම්පතින් පංගුවක් අපට දෙන්නට නීතියකුත් තිබෙනවා.

ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා ලෙස කටයුතු කල කාලයේ මේ පිලිබඳව විශාල වැඩ කොටසක් කලා. අත්තටම අපට යුරෝපයේ බැලපෑම් ආවා. අපේ ධීවර කර්මාන්තයට අදාල මේ නියාමන කටයුතු හරියට කරන්නේ නැතත කියලා. ඒ නිසා යුරෝපා ධීවර සම්මුතිය යටතේ අපට අපේ ධීවර සම්පත යුරෝපයට අපනයනය කිරීමෙත් ගැටලූව මතු වුනා. මේ කියන කාරණා අත්තටම අපේ විදේශ ධීවර යාත්‍රා නියාමන පනත යටතේ ක්‍රියාත්මක කල හැකියි. නමුත් මේ ඉන්දියානු හා ලංකා මුහුදු සීමාවේ තිබෙන ගැටලූ විසදා ගැනීමට ඒ නිතිය අපට ක්‍රියාත්මක කරන්න පුළුවන්කමක් නැහැ. මේක වෙනම විධියේ ගැටලූවක්. කාලයාගේ ඇවෑමෙන් එය භුක්තියට සවි වී තිබෙනවා. ඒකයි මේ වෙලා තිබෙන්නේ. එදා බෝට්ටු එකක් දෙකක් එහාට මෙහාට ගියා. ඒ වගේ නොවෙයි. දැන් සිද්ධ වන්නේ ඒ නිසා මේක බරපතල කාරණයක්. එහෙම නම් පළමුවෙනි කාරණය වන්නේ අපේ ධීවරයන්ගේ ජීවනෝපාය අප රැකදීමයි. ඔවුන්ගේ ජීවනෝපාය රැක දෙන්න බැරි නම් අප ඔවුන්ට ජීවනෝපාය ආධාරයක් ලබා දිය යුතුයි. ඒකයි මෙහි පළමුවැනි ප්‍රමුඛතාවය.

දෙවැනි කාරණය මේකයි. ගරු සම්පන්දන්



# ඔක්තෝබර් විප්ලවයේ ඓතිහාසික වැදගත්කම හා වත්මන් ජාත්‍යන්තර අභියෝග

**-කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් ඩිව් ගුණසේකර සහෝදරයා-**

ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයේ 98 වෙනි සංවත්සරය නොවැම්බර් 07 වෙනිදාට යෙදී තිබුනි. ඒ පිලිබඳ දේශනයක් කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් ඩිව් ගුණසේකර සහෝදරයා විසින් සුගීෂ්වර ශාලාවේදී පවත්වන ලද අතර පළමු වෙනි ලෝක යුද්ධයේ පීඩාවට පත්ව සිටි ජනතාව නිදහස,සාමය,පාන් පිලිබඳ සටන්පාඨ මුල් කර ගනිමින් ඔක්තෝබර් විප්ලවය සාර්ගේ රාජාන්ඩු පාලනය බිඳ දැමීම සඳහා ජනතාව නැගිටුවා ගැනීමට ලෙනින් සහෝදරයාට හැකි විය. මෙහිදී සංවිධානාත්මක ප්‍රබල වාමාංශික පිරිස ලෙස එක්ව කටයුතු කළ බොල්ෂෙවික්වරුන්ට ලෙනින් සහෝදරයාගේ නායකත්වයෙන් යුත් මධ්‍යම කාරක සභාව මගින් නිසි මඟ පෙන්වීමක් සිදු විය.

විප්ලවය ජයගත් විගස ලෙනින් සහෝදරයා පලමුව ලෝක යුද්ධය නතර කර සාමය පිලිබඳ පණිවිඩය නිකුත් කළ අතර සාර් අධිරාජ්‍ය යටතේ තිබුණු රටවල් වලට නිදහස ලබාදීම අරඹන ලදි. මෙහිදී පින්ලන්තයේදී සාමය ලබාදීම පිලිබඳ ගිවිසුම අත්සන් කිරීමට ට්‍රොට්ස්කි සහෝදරයා නම් කර යවා පලමු ආදර්ශය සපයන ලදි.
ඔක්තෝබර් විප්ලවයේ ඓතිහාසික වැදගත්කම අදටත් වලංගු වනනේ කරුණු කීපයක් මුල් කර ගෙනය. එනම් අධිරාජ්‍යවාදී රටවල් කීපයක් ලෙස නොව තනි බලයක් ලෙස ලෝකය හසුරුවා ගැනීමට උත්සාහ කරනු ලබන නව ලිබරල් නූතන අධිරාජ්‍යවාදයේ ස්වරූපය හඳුනා ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් ලෙස පවතී. 1917 විප්ලවයෙන් ඇරඹුනු යටත් විජිතවාදය බිඳ දැමීමේ අරගලය කෙළවරකට ගෙන ඒමට හැකි වූයේ 1975දී වියට්නාම් යුද්ධය අවසන් කර නිදහස ලබා ගැනීමෙන් අනතුරුවය. අනෙක් කරුණ වන්නේ අදෘශ්‍යමාන හස්තයකින් මෙහෙයවන බව කියන ''වෙළඳ පොල'' ආර්ථිකය වෙනුවට ''ක්‍රම සම්පදනය'' ආර්ථික සංකල්පය හඳුන්වාදීමය. දැනට එය ධනපති ලෝකය ඇතුලු සියළු රටවල ක්‍රියාවට නඟන ක්‍රමයක් වී තිබේ.

ධනවාදී රටවල ආර්ථික අර්බුදයට විසඳුම් සෙවීමට සූදානම් වූයේ නැවත දෙවන ලෝක යුද්ධය ආරම්භ කිරීමත් සමඟය. නමුත් ඒ වන විට සෝවියට සංගමය පැවති නිසා පැසිට්වාදය පරාජය කිරීමට හැකි විය. එසේම ලෝක සාමය හා සුරක්ෂිතතාවය මුල්කර එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිවීමේදීද සෝවියට් සංගමය සම පාර්ශව කරුවෙකු ලෙස කටයුතු කිරීම නිසා අදටත් තුන්වෙනි ලෝක යුද්ධයක් ඇති වීමේ ප්‍රවනතාවය වැලකී තිබේ.


1991 දී සෝවියට් සංගමය බිඳ වැටුනු පසු නව ලිබරල්වාදී නූතන අධිරාජ්‍යවාදය ලොව පුරා ව්‍යාප්ත විය. එහි අසාර්ථකත්වය දියුණු ධනපති ලෝකයේ මතුවූ ආර්ථික බිඳවැටීම නිසාත් 2007-2013 ආර්ථික අවපාත තත්ත්වය තවමත් නිසිලෙස සමනය නොවී දිග් ඇදෙමින් පවතී. එනිසා ලෝක ආර්ථිකය මෙහෙයවීම හා අර්බුද කළමනාකරණය කර ගැනීම සඳහා නව උපක්‍රම සූක්ෂම ලෙස ක්‍රියාත්මක කරමින් තිබේ. ලෝකය යලි බෙදා ගැනීම සඳහා ලෝක යුද්ධයක් ඇවිලීමට අධිරාජ්‍යවාදී බලවතුන්ට අවශ්‍ය වුවත් පවතින ගෝලීය කොන්දේසි නිසා එවැන්නකට ඉඩකඩක් නැත. එනිසා අන්තවාදය එක් අතකින් උපයෝගී කර ගන්නා අතර අනිත් අතින් සාමකාමී රටවල්වලට කඩා පැන සම්පත් කොල්ලකෑම අරඹා තිබේ. එය ක්‍රම තුනක් යටතේ සිදු කරයි. රටවල් තුලට කඩා වැදීම, රටවල් අභ්‍යන්තරය අවුල්කර දුර්වල පාලකයින් පත් කිරීම, රටවල් තනිකර පාලකයින් මාරු කිරීම යන ක්‍රමවේධ පාවිච්චි කරයි. ලංකාවේදී ඔවුන් පාවිච්චි කලේ පාලකයින් මාරු කිරීම හා රූකඩ පාලකයින් පත් කිරීමේ පිලිවෙතයි. දැන් සිදු කිරීමට උත්සාහ කරන්නේ රට අභ්‍යන්තරයේ අස්ථාවරත්වය ගොඩ නැගීමටයි. එයින් ඔවුන් සූදානම් වන්නේ ආසියානු කලාපයේ මෙහෙයුම් කටයුතු සඳහා අධිරාජ්‍යවාදීන්ට හිතවාදී දුර්වල පාලන තන්ත්‍රයක් රටතුල ස්ථාපිතව තබා ගැනීමයි.

වර්ථමානයේ අධිරාජ්‍යවාදය අර්බුද කීපයකට මුහුණ දෙමින් තිබේ. එනම් ආසියානු ආර්ථිකය ලෝක ආර්ථිකය මෙහෙයවන තත්ත්වයට පත් වෙමින් ඇත. චීනය ලෝක ආර්ථික බලවතා බවට පත්වීමත් ඉන්දියාව වේගයෙන්ම දියුණුවන ආර්ථිකය බවට පත්වීමත් එකවිට සිදු වෙමින් තිබේ. ලතින් ඇමරිකාවේ බලතුලනය අධිරාජ්‍යවාදයට අහිතකර ලෙස මුළුමනින්ම වෙනස්වී තිබේ. රුසියාව නැවත නැගිටිමින් මධ්‍යම ආසියානු රටවල් එක් කර යුරෝ-ආසියා කලාපය බිහිකර තිබේ. යුරෝපා මහාද්වීපය ලෝක ආර්ථිකය තුල දුර්වලවීමත්, වැඩිම ණයගැති රටවල් බවට ඇමරිකාව හා ජපානය පත්වී තිබේ. ලෝක බැංකුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙනුවට විකල්ප බැංකුවක් හා මූල්‍ය අරමුදලක් බිහිවී ඇත. අන්තර් මහාද්වීප නව ආර්ථික කලාපයක් ලෙස බ්‍රික්ස් සංවිධානය පත්ව තිබේ.
නව වටපිටාව යටතේ අධිරාජ්‍යවාදයේ පැරණි උපක්‍රම බිඳ වැටෙමින් තිබේ. එසේම ප්‍රාග්ධනය හා ශ්‍රමය අතර පැවති ප්‍රතිවිරෝධතාවය තිබුණු වෙමින් අධිරාජ්‍යවාදය හා ලෝක ජනතාව අතර පවතින ප්‍රතිවිරෝධතාවය ප්‍රමුඛත්වයට පත් වෙමින් තිබේ. ලොව පුරා රටවල් අතර යුද්ධ ඇති කිරීමට අධිරාජ්‍යවාදය කටයුතු කරන්නේ ආර්ථික අර්බුදයට දේශපාලන විසඳුම් සොයා ගැනීම වෙනුවෙනි.

නව ලිබරල්වාදයේ දෙවන රැල්ල මිල්ටන් ප්‍රීඩ්මාන්ගේ මූල්‍ය දර්ශනය මත පදනම්ව 1980 සිට වේගවත්ව ඉදිරියට ඇදුනි. සමාජවාදී රාජ්‍ය පද්ධතිය බිඳවැටුනු 1990 වන විට එහි උපරිමයන් කරා ගමන් කරන ලදි. එතැන් පටන් පසු බැසීම ආරම්භ විය. 2007 අර්ථික බිඳවැටීම ආරම්භවීම නිසා නව ලිබරල් දෙවන රැල්ල අර්බුදයෙන් අර්බුදයට ගමන් කරමින් පසු බැස්මට ලක්ව තිබේ. ඒ අතර තුර නව ලිබරල්වාදී රැල්ල බිඳවැටෙන විට චීනය ආර්ථික බලවතෙකු බවට පත්වීමත් ඉන්දියාවේ ආර්ථික වර්ධනයත් නව සාධකයන් ලෙස ඉස්මතු වෙමින් තිබේ. චීනය දෙවෙනි ලෝක ආර්ථික බලවතා වීමත්, ප්‍රධානතම ආනයන අපනයන රටවීමත්, ප්‍රබල ලෝක මහා ද්වීපික ආයෝජකයෙකු වීමත්, චීන යුවාන් මුදල විදේශ වෙළඳ ගනුදෙනුවල දෙවෙනි තැනට පත්වීමත්, ලෝකයේ ඩොලර් සංචිතයෙන් 1/3ක් චීනය සතුව පැවතීමත්, චීනයේ දල දේශීත නිෂ්පාදිතය ඩොලර් ට්‍රිලියන 14 මට්ටමකට පැවතීමත්, දරිද්‍රතාවය 22% සිට 6% දක්වා අඩුකර ගැනීමත්, 2027 දී ලෝක ආර්ථික බලවතා බවට පත්වීමත් අනුව වෙලඳපොල සමාජවාදී පියවර නව ලිබරල් වාදයට අභියෝග එල්ල කරන නව ව්‍යුහයන් කරා ගමන් කිරීමේ ලක්ෂණ මතුවිය හැකිය.

## රනිල්ගේ ගජමිතුරු ක්‍රියාකලාපය ගැන

# යූ.ඇන්.පි.යේ කලබැගෑනියක්



අගමැති රනිල් වික්‍රමසිංහ මහතා දින සියයේ ආණ්ඩුවේ සිට මේ දක්වා තෝරාබේරාගත් තමන්ගේ හිතවතුන්ට එම හිතවත්කම් අනුව හා යම් යම් ඕනෑ එපාකම් අනුව රට පාලනය කිරීමට සූදානම් වීම ගැන යූ.ඇන්.පි. ය ඇතුලතින්ම විරෝධය එල්ලවීමට පටන් ගෙන ඇත.
ආසන්න වශයෙන් මෙයට මුල් වී ඇත්තේ ඇවන්ගාඩ් සිද්ධිය පිලිබඳව පාර්ලිමේන්තුවේදී අමාත්‍ය මාරපන මහතාත්, විජේදාස රාජපක්ෂ මහතාත් දැක් වූ අදහස්වලට විරුද්ධව මෑතකදී යූ.ඇන්.පි.ය. සමඟ එක්වූ අමාත්‍ය රාජිත, චම්පික, අර්ජුන යන අමාත්‍යවරුන් පිරිසක් විසින් රනිල් මහතාගේ අගමැති ධූරයේ පවතින අමාත්‍ය මණ්ඩල සංහිදියාව බිඳි යන ආකාරයෙන් කරුණු මතු කිරීමය. ඇමති මණ්ඩලය තුල පවතින පරස්පර අදහස් ඇමති මණ්ඩලයටත් නොකියා ඇමතිවරුන් දෙදෙනෙක් පාර්ලිමේන්තුව හරහා ජනමාධ්‍යවෙත ගෙන ඒම රාජිත ආදී ඇමතිවරුන්ගේ විරෝධයට හේතුවී ඇත. ජනාධිපතිවරයා ඉතා වෙහෙසකර ලෙස පක්ෂ දෙකේ දක්ෂිනාංශික දේශපාලන පූට්ටුව ඉදිරියට ගෙන යාමට උත්සාහ කරමින් දේශපාලන කණ්ඩායම් ඇතුලත ප්‍රශ්ණ විසඳා ගැනීමේ න්‍යාය ගැන උපදෙස් දෙනු ලැබුවත්, පක්ෂ අභ්‍යන්තර දේශපාලන ගැටුම් උත්සන්න වෙමින් විදාරනය වීමේ ලක්ෂය කරා වේගයෙන් ඇදී යමින් පවතී. මෙයට හේතුවන ආසන්න සිද්ධිය ඇවන්ගාඩ් වුවද චම්පික, රාජිත, රවි හා අර්ජුන යන ඇමතිවරුන්ට රනිල් සමඟ ගැඹුරට විහිදුනු ප්‍රතිවිරෝධයන් ඇති බව රහසක් නොවේ.
මහ බැංකු මගඩිය, ඇවන්ගාඩ් හුටපටය සැකකටයුතු ගල් අඟුරු ටෙන්ඩරයට විරුද්ධව පවරා ඇති නඩුව යන කරුණු තුන ගැනම අගමැති රනිල්ගේ ගජමිතුරු ක්‍රියාකලාය පිලිබඳව අමාත්‍ය මණ්ඩලය තුලත්, යූ.ඇන්.පී. මන්ත්‍රිවරුන් අතරත් කලකිරීමක් හා කුකුසක් මතු වෙමින් තිබේ.
මහබැංකු මගඩිය රනිල් අගමැතිගේ උවමනාව අනුව සිදු කරන ලද අතර ඒ පිලිබඳව ප්‍රශ්ණය මතු කිරීමට ඇති ඉඩකඩ එකින් එක වසමින් ජාත්‍යන්තරව සැකසහිත විදේශිකයෙකු තවදුරටත් මහ බැංකු අධිපති තනතුරේ රඳවා ගෙන සිටින්නේ රනිල්ගේ උවමනාව මත බවට යූ.ඇන්.පි.ය. අතුලතින්ම ප්‍රශ්ණ මතුවෙමින් තිබේ. එනිසා රටේ ආර්ථික වර්ධනය පහල වැටීමත්, රුපියල බාල්දුවීමත්, විදේශ සංචිත සිඝ්‍රයෙන් දියවීයාමත් පාරිභෝගික මිලගණන් ඉහලයාමත් ගැමි නිෂ්පාදන වල මිල පහල බැසීමත් සිදුවෙමින් පැවතීම යූ.ඇන්.පි.ය තුල සිටින බුද්ධිමත් ඇමතිවරුන්ටත් මන්ත්‍රිවරුන්ටත් දරාගත නොහැකි ලෙස පෙනෙන්නට පටන් ගෙන ඇතැයි වාර්තාවේ. එනිසා පසුගිය කෝප් වාර්තාව දැනට පත්කර ඇති කෝප් කමිටුවට ඉදිරිපත් කර එය පාර්ලිමේන්තුවට ලබාදිය යුතුය. මහ බැංකු අධිපති වැරදිකරුවෙකු වුවහොත් ඔහුව හිතුමතේ තනතුරේ රඳවාගත් අගමැතිතුමා වැරදි පිළිගෙන ඉල්ලා අස්විය යුතුයැයි මතයක්ද අමාත්‍ය මන්ඩල අභ්‍යන්තරයෙන් මතුවෙමින් තිබේ.
ඇවන්ගාඩ් සිද්ධියේ දී බැලූ බැල්මටම පෙනෙන ආකාරයේ අව කටයුතු රාශියක් සිදුවී තිබියදී එයට විරුද්ධව නඩු පැවරිය නොහැකි බවට පාර්ලිමේන්තුවේදී මාරපන අමාත්‍යවරයා දැක්වූ අදහස නිසා යූ.ඇන්.පි.යේ බොහෝ අමාත්‍යවරුන්ගේ කෝපය උත්සන්න වෙමින් ඇත. මෙම සිද්ධියේදී නාවික හමුදාවට අයත්ව තිබූ, නාවික හමුදාව විසින් රටට විශාල


## සිසුන්ට එල්ල කළ පොලිස් ප්‍රහාරය

# දැඩි විරෝධයෙන් හෙලා දකිමු

පසුගිය දිනක උසස් ජාතික ඩිප්ලෝමා සිසුන්ට පොලිසිය විසින් එල්ල කළ නහීන ප්‍රහාරය දැඩි විරෝධයෙන් යුතුව හෙලා දකිමු යනුවෙන් ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ ලේකම් වාසුදේව නානායක්කාර සහෝදරයා විසින් නිකුත් කල නිවේදනයක දැක්වේ.

එක්ව රැස්වීම, සාමකාමීව උද්ඝෝෂණය කිරීම, පෙල පාලියාම අප රටේ ව්‍යවස්ථාව මගින්ද ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු මගින්ද තහවුරුව නීතිගත වූ මූලික අයිතිවාසිකමක්ය. කරුණු එසේ තිබියදී පොලිසියේ මෙම ක්‍රියාකලාපය පවතින නීතියට පිටින් නිලධාරින්ගේ අනිසි කෝපයෙන් ක්‍රියාත්මක කළබරපතල පියවරකි.
උසස් ජාතික ඩිප්ලෝමා සිසුන්තමන් මුහුණ දෙන වෘත්තීක අධ්‍යාපනික ගැටළුව වසර ගණනාවක සිට රජයට ඉදිරිපත් කර තිබේ. එයට සාධාරණ විසඳුමක් ලබාගැනීම සඳහා රජයේ හා නිලධාරින්ගේද,මහජනතාවගේද අවධානය ලබා ගැනීම සඳහා එම සිසුන් සාමකාමීඋද්ඝෝෂණ ක්‍රියාමාර්ගයෙහි නිරතවීම කිසිවෙකුටත් අරුමයක් නොවේ.
පසුගිය දිගුකලක සිට නොයෙක් විට සිසුන්පාරට පැමිණ පෙලපාලියමින් උඝෝෂණය කිරීමත්, නිලධාරින් සමඟ සාකච්ඡා වලින් පසුව එකඟතාවයෙන් විසිරයාමත්, අට්ටාල මත හෝ පදිකවේදිකාවේ සිට හෝ අඛණ්ඩ සත්‍යග්‍රහ ක්‍රියාකාරීත්වයන් හිනිරත වීමත්, ප්‍රතිපාදන කොමිසම ඉදිරියේ හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරියේ රැස්වෙමින් සිසු අයිතීන් ආරක්ෂාකර ගැනුන බව කිසිවෙකුටත් අමතක නැත.
පොලිසිය සමඟ ගැටුම් මතුවූයේ සිසුන් අධි ආරක්ෂිත කලාපවලට ඇතුලුවීමට ගිය අවස්ථාවන්හිදීය. ජනාධිපතිවරණය ආසන්නයේදී අධිආරක්ෂක කලාපයද විවර කරගෙන,පොලිස් බාධක බිඳගෙන, ජල ප්‍රහාරද නොතකා පෙල පාලියෙන් පැමිණි සිසුන් අරලියගහ මන්දිරය ඉදිරිපිට ගාලු පාරවසා ගනිමින් වාඩිලා ගෙනඋද් ඝෝෂණය කළ ආකාරය සිසුන්ටත්, පොලිසියටත්, දේශපාලකයින් ඇතුළු රජයටත් මතක්කර දිය යුතුව ඇත. එහිදී සිසුන් සාමකාමීව නැගිට ගියේ ජනාධිපති කාර්යාලයෙන් සාකච්ඡාවට අවස්ථාවක් ලැබීමෙන් පසුව සිසුනායක පිරිසක් එයට සහභාගී වීමෙන් අනතුරුවය.
වර්තමාන රජය යටතේ සිසුන්ට පහරදුන් දෙවන අවස්ථාව මෙය විය. උද්ඝෝෂණය කරන සිසුන්ට මෙන්ම පුරවැසියන්ටද මහජන පීඩාව යටතේ නඩු පැවරීමද වර්තමාන රජය අනුගමනය කරන පිලිවෙත බව පෙන්වා දී ඇත.
මෙම පොලිස් ප්‍රහාරය ගැන මහජන සාමය හා ආරක්ෂාවභාර අමාත්‍යවරයාගේ නියෝග අනුව පොලිසිය ක්‍රියා කලේද, නොකලේද යන්න පිලිබඳව එම අමත්‍යවරයා ප්‍රකාශ කළයුතුය. දැන් එක්අතකින් පොලිස් කොමිසමත්,අනිත් අතින් අගමැතිවරයාත් මාධ්‍ය මගින් කරුණු සොයා බලන බවට ප්‍රකාශ නිකුත් කරමින් තිබේ. එසේ නම් පලමුව සිසුන්ට එරෙහිව දැනට අධිකරණයට ලබා දී ඇති වාර්තා අස්කර ගැනීමට උපදෙස් දිය යුතුව ඇත. දෙවනුව මෙම පොලිස් පහරදීමේ වගකීම මුළු මනින්ම රජය විසින් භාරගෙන ඒ පිලිබඳව කණගාටුව ප්‍රකාශ කළයුතුය. තෙවනුව වැරදි කළ නිලධාරින්ට දඬුවම් පැමිණවිය යුතුය. පහර කෑමට ගොදුරු වී තුවාල ලබාසිටින සිසුන්ට වන්දියක්ද ගෙවිය යුතුය.

# ඇඩ්‍රස් නෑ.



ජැක්සන් ඇන්තනීගේ "ඇඩ්‍රස් නෑ" චිත්‍රපටය ගැනරිදි තිරයට එක්වීමට පෙර ගෙන ගිය ආන්දෝලනය තුල මානම් සිතුවේ එය පෙර නොවූ විරූ අන්දමකින් ප්‍රකට කරාවි කියාය. ජැකා මෙම චිත්‍රපයට ගැන කිව්වේ නම් පන්තිය ගැන කියැවෙන චිත්‍රපටයක් වශයෙනි. මෙම චිත්‍රපටය, කලා කෘතියක් කියන්නේ ප්‍රඥාවෙන් ආරම්භ වී ආනන්දයෙන් නිමවන්නකි. ඒ ගැනය "ඇඩ්‍රස් නෑ" තුලින් ගම්‍ය නොවීම කණගාටුවට කරුණකි. ජැකා ප්‍රතිභා පූර්ණ මෙන්ම පරිකල්පනයෙන් හෙබි නිර්මාණශීලි අයෙකුට මෙන්ම චිත්‍රපටයට අත ගැසීම කණගාටුවට කරුණක් වේ.

සිනමාවංශ කථාවේ ලුම්පන් පන්තිය ගැන චිත්‍රපට තේමාවවූ අවස්ථා තුනක්වේ. ධර්මසේන පතිරාජ නිපැයූ, ''සොල්දාදුඋන්නැහේ'' මෙහිලා විශිෂ්ඨතම නිර්මාණය වේ. ගණිකාවන්වූ ප්‍රේමවතී (මාලනී ෆොන්සේකා) විලි මහත්තයා (හෙන්රි ජයසේන)චුට්ටේ (නීල්අලස්)සමඟ ද සොල්දාදුවා (ජෝඅබේවික්‍රම) මේ චරිතවල වාසස්ථානය ගාළු මුවදොර ප්‍රදිපාගාරය අසල ඇතිබිම කඩය. මෙ මගින් අදාල චරිතවලට ගැඹුරින් එබී බැලීය පතිරාජගේ පාර දිගේ අගක් මුලක් වූ බව සයුරේ අත්මුල් නැති තරුණයෙකු ගැන කියවන කථාවකි. ටයිටස් තොටවත්තගේ ලුප්පන් පංතිය මෙන්ම මුඩුක්කු ජනජීවිතය මැනවින් විවරණය කලේය. නාට්‍යකරුවන් අතර ආර්.ආර්. සමරකෝන් කැළණි පාලම, අහසින් වැටුනු මිනිසෙක් තුලින් මෙම පන්තියේ ජඩකම්, පහරකම් මෙන්ම දුඛ්‍ය දොම්නස්නයන් මැනවින් ප්‍රකට කලේය. මේවායින් ප්‍රකට වු ගැඹුරු ඇඩ්‍රස් නෑ තුල නෑ. එයව නාහි පැරණි සිංහල චිත්‍රපට ආකෘතිය අවිඳු නිර්මාණයකි. මට මේලෙස ලිවීම ගැන කණගාටු වෙමි.

ජැක්සන්ගේ ඇඩ්‍රස් නෑ චිත්‍රපටය පැමණි සිනමා උගරුව ගියේ යම්කිසි නිවැරදි දිශාවකටය. පැසිස්ට්, ලව්, සින්දු මේ හැට අතර පහන් පොලේ විහිලූ ද ඇත. චිත්‍රපටය දුවන්න උපයෝගිකර ගන්නේ මේ වට්ටෝරුවය. හිගන මුදලාලි (හිට්ලර්) ඔහුගේ අතින් තැන තැන ලගින හිඟන්නෙක්. එයින් මුදල් ඉපයුම මිනිමරණ කොන්ත්‍රාත්, මන්ත්‍රී පුතා, චැප්ලින්ගේ දියණියගේ ප්‍රේමය, විදි දරුවන් සොයා යන සමාජ සේවක පිරිසක් මේ සියල්ල අලලා පැය දෙකහමාරක් එක්කොට ඇත. සමහර ඒවා දෛවෝග පැසිදුවිම්ය.

මේ පන්තිය දෙස යථාවාදිව බැලීමට ජැක්සන් අසමත් වී ඇත. එම පන්තිය මිනිසුන්ගේ ජීවිත හදුන්වන්නේ ආර්.ආර්. සමරකෝන් කැළණිපාලම් ජීවිත ලෙසය. ඇඩ්‍රස් නෑ පන්තියේ දුඛ්‍ය දෝමනස්නය මෙන්ම සටකපටකම් මෙම චිත්‍රපටයෙන් විවරණය නොවේ. නුම්පන් පන්තිය ගැනනි වැරදි විග්‍රහයකයෙදීමට මෙම චිත්‍රපටය යොමු වී නැත. ගෙයක් දොරක් නැති අහසක් පොළවක් අතර රැළි රැකියා නැති, ස්ථිර අරමුණක් නැති ඔවුන් සැබවින්ම පාවෙන චරිතයෝය. මේ රටේ දේශපාලන ඉතිහාසයේ ධනවාදී පක්ෂවල මැතිවණ මගින් පරපෝෂිත වූ බව අපගෙන් වැඩි දෙනාටම දැන ගැනීම මේ පන්තිය ප්‍රයෝජන ගන්නේය.

ලුම්පන් පන්තිය ඇවැතුම් පැවතුම් කුමක්ද? යන්න ඔහු තේරුම් ගත්තා නම් මෙම චිත්‍රපටයේ චරිත හා සිද්ධින් මීට වඩා හරවත් කිරීමට හැකිවනු ඇත. වංචාව මෙම චරිත වලින් ගම්‍ය නොවේ. මෙහිදි හුදෙක් හිගාකෑමක්, ගණිකාවන්, යොමුව ු පිලිවිත් ගැහැණුන් සිමාවන්නෝය. අනික් අත ගිය ගැහැණියකගේ ලයෝ වේදනාව යන්තමින් හෝ විවරණ්‍ය වන්නේ සමිතා ගේ චරිතය තුලිනි.

ජැක්සන් කියන්නේ අපි නොදන්නා ලෝකය අපි හිතනවාට වඩා භයානකය. නාසි වන්නේ අප අහිංසකයි. සත් ගුනවත් අප සංකීර්ණය. ඒ නිසා ලෝකය ඉපදුම දවසේ අන්ධකාරය ඉපදුනා. පොහොසත්කම ඉපදුනු දාමයෙන් දුප්පත්කම ඉපදුනා. ඇත්ත ඉපදුනු දවසේම බොරුව ඉපදුනා.

එහෙම කිව්වට ජැක්සන් ඔබේ නිර්මාණයෙන් එවන්නක් නැත. මෙහි චරිතවල අනන්‍යතාවයක් නැති නිසා ඇඩ්‍රස් ද නැත.

# අධ්‍යාපනය පුද්ගලීකරණයට එරෙහි විය යුතුය.

අන්තර් විශ්ව විද්‍යාලීය ශිෂ්‍ය බල මණ්ඩලය විසින් ඉහත මාතෘකාව යටතේ සාකච්ඡා සභාවක් පසුගිය 03 වෙනි දා මහවැලිකේන්ද්‍රයේදී පැවැත්වීමට සුදානම්කර තිබුණු අතර එයට රජයේ බාධා එල්ල වී වෙන් කල ශාලාව ඉඩකඩ නොදීමේ ප්‍රශ්නයක් මතුවිය.

එම සිද්ධියෙන් පසුවත් රැස්වීම නොතිබූ සිසු නායකයින් වහා මැදිහත්ව සච්සිරිපාය ශාලාවේදී එම රැස්වීම පැවැත්විය.

මෙම රැස්වීමට සහභාගිවු සමසමාජ පක්ෂයේ නායක මහාචාර්ය තිස්සවිතාරණ සහෝදරයා ප්‍රකාශකර සිටියේ නිදහස් අධ්‍යාපනය පිලිබඳ සටන ආරම්භවන්නේ සුරියමල් ව්‍යාපාරයේ සිට බවයි. එදා අධිරාජ්‍යවාදී යුගයේදී ඇරඹුණු නිදහස් අධ්‍යාපනය පිලිබඳ අදහස් දිවංගත ආචාර්ය එන්.එම්. පෙරේරා සහෝදරයා විසින් අත්අඩංගුවේ සිටිමින් පොතක් ලෙෂ ප්‍රකාශයට පත් කළ බවත් එහි බලපෑම නිසා කන්නන්ගර ප්‍රතිපත්තිය ඇති කිරීමට හැකි වු බවත් එදා දක්ෂිණාංශිකයින් අධිරාජ්‍යවාදයත් සමග එක්ව සිටිමින් වාමාංශිකයන් හා ප්‍රගතිශීලින් විසින් නිදහස් අධ්‍යාපන පනත සම්මත කර ගැනීමට පෙරමුණ ගත් බව ද සඳහන් කලේය. වැඩිදුරටත් කථා කල මහාචාර්ය තිස්ස සහෝදරයා ප්‍රකාශ කලේ සමාජවාදී ජනතා පෙරමුණ ලෙස වාමාංශික සියලු දෙනාම අධ්‍යාපනයට වැඩියෙන් මුදල් හා පහසුකම් වෙන්කිරීම ගැන පසුගිය ආණ්ඩුකාලයේදී පෙනීසිටි බවත් නව ලිබරල් පිළිවෙත අනුගමනය කරනු ලබන වර්තමාන ආණ්ඩුව කුමක් ප්‍රකාශ කලත් ඔවුන් නැඹුරුවන්නේ ජනතාවට අධ්‍යාපනය ලබා දීමට වඩා අධ්‍යාපනය වෙළඳ භාණ්ඩයක් ලෙෂ යොදා ගෙන ලාභ උපයා ගැනීම ව්‍යාපාරිකයන්ට ඉඩකඩ ලබා දීම බව ද පෙන්වා දුන්නේය.

මෙම රැස්වීමට සහභාගීවු ඇතැම් වාමාංශික මතධාරින් ප්‍රකාශ කලේ ලෝක සමාජවාදී ව්‍යාපාරයෙන් පසුව ලබාදෙන යුතුය. ආණ්ඩුව වෙනුවෙන් ඉල්ලනු ලැබූ අයගේ අදහස් වුයේ අධ්‍යාපනය සඳහා වැඩිපුර පහසුකම් ලබා දීම රජයට කරුණු ඉදිරිපත් කරන බවය. යූ.එන්.පීය නියෝජනය කරමින් පැමිණි පිරිස පවතින පහසුකම් වැඩිදියුණු කරන බවය. නමුත් 1977 න් පසු ඇරඹුනු යූ.එන්.පී. ආණ්ඩුව විසින් අධ්‍යාපනය කප්පාදුවට ඉදිරිපත් කල ධවල පත්‍රිකාව පරාජයට පත්කලේ භික්ෂුන් විසින් ජීවිත පරිත්‍යාගයෙන් සිදු කල සටන් ඉතිහාසයත් සමග බව මොවුන්ට අමතකය.

මෙම සාකච්ඡාවේ කැඳවුම්කරු ලෙස සහභාගීවු ලහිරු වීරසේකර සිසුවා විසින් දැනුම්දෙනු ලැබුවේ නිදහස් අධ්‍යාපනය රැක ගැනීම සිසුන් පමණක් නොවන අතර එය සිසුන් මෙන්ම දෙමාපියන් පොදු ජනතාව සියලු ප්‍රජාතන්ත්‍රවාදය අගයන දේශපාලන බලධාරින් එක්ව මතු පරපුර වෙනුවෙන් ඉටු කල යුතු පුළුල් මෙහෙවරක් වන බවය.

## අපගේ ශෝකය

## වාමාංශික අපට ධෛර්යයක් හා ආශ්වාදයක්වු අපේ සිරිමල්.

දැනට වසර 30 කට පමණ පෙර තම තුරුණුවියෙහි දී සිරිමල් ඇහැලියගොඩ වාමාංශික ක්‍රියාකාරිත්වයට ඇදි අවේ කාන්දමක් ලෙසින්ය. ඉමහත් කැපවීමෙන් සහ උද්යෝගයෙන් දේශපාලන කටයුතු වලට මැදිහත්වූ ඔහුසෑම අවස්ථාවකම සෑම සිද්ධියකම කැපී පෙනෙන ලෙස දැකගත හැකිවිය. තර්ක විතර්කයේ දස්කම් තිබූ එහු විවිධ අවස්ථාවන්දිහි අපට වැරදුනු තැන්හෝ අපට බැරිවුදේ ගැන හේතු සහිතව විවාද කලේ සහෝදරත්වයරකිමින්ය. ඔහු රැකියාව කලේ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේය. පසුව එය ටෙලිකොම් විය. ඔහුට ලැබුණු සැලකිය යුතු වැටුපෙන්ඔහුදේශපාලනයටලොකු පංගුවක්වැයකලේඑයදේවභාරය්කමෙන්ය. ඊට අමතරව කාහටත් නොකියාම කවුරුත් නොදැනම තවත් ලොකු මුදල් හදල් ඔහු ඉතාම දුගීඅසල්වාසීන්ට පරිත්‍යාග කලේය. මැයි දින උත්සවයට කොළම ගමනට වියදම් එකතු කිරීම ආරම්භ වන්නේ සිරිමල්ගේ නිර්ලෝභී මැදිහත් වීමෙන්ය. ඔහු සෙසු සගයන්ට ඒ අතින් ද ක්‍රියාකාරිත්වය අතින් ද ආදර්ශයක් විය. වාසු සහෝදරයා මට විනාඩි 2 ක් කථා කරන්න ඕන කියා මාවෙත එන ඔහු ඉතාවැදගත් කාලීන ප්‍රශ්න දෙක තුනක් විමසා මගෙන් පිලිතුරු ලබා අනතුරුව තවත් අදහස් කිහිපයක් දක්වා එහෙනම් මංයන්නම් සහෝදරයා කියමින් පිටවෙයි.

සිරිමල් ද, සරත් ද, නිව්ටන් ද එක කුසඋපන් සොහොයුරන්ය. සරත් කල්පනා කාරිව සැලසුමක් පිලිවෙල කොට අපට සහය වී නම් නිව්ටන් ප්‍රබලම ක්‍රියාකාරි වේගවත් පුද්ගලයා විය. මොවුන්ගෙන් පියා තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තු-ව වෘත්තීය සමිති නායකයෙකු වු අතර දරුවන් වෙත වාමාංශික මතය දායාද කොට ඇත්තේ ඔහු විසින් බව සිරිමල්ගේ අවමගුල දිනයේමට දැන ගතිමි.
සිරිමල්ගේ සෞඛ්‍ය යම් තරමකට ඔහුගේ පසුකාලීන ජීවිතයේ ක්‍රියා කාරිත්වයට බාධාවක් විය. ස්ථිරසාර අධිෂ්ඨානය මියගොස් සැතපී සිටියදී වුව ද ඔහුගේ මුවගෙහිදිස්විය. අපගේ ආචාරය පුදමින් අප වෙතින් නික්ම යන ඔහුගේ ජීවන ආදර්ශයේ සුවඳ අපි ඉතිරිකර ගනිමු.

---

ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුනේ විධායක සභිකයෙකු හා ශක්තිය කතෘ මණ්ඩල සාමාජිකයෙකු වු සරත් රණසිංහ සහෝදරයාගේ ආදරනීය මෑනියන් හදිසියේ වියෝවිය. එතුමියගේ අවසන් කටයුතු බණ්ඩාරගම දී සිදු කරන ලද අතර ශක්තියේ සංවේගය පලකරමු.

---

ඇහැලියගොඩ මුදුන්කොටුවේ විසූ ජනතාවාදී ක්‍රියාකාරිත්වයේ ගම් නායකයෙකු වු කුලරත්න අප්පෝගේ අභාවය ගැන ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ සංවේගය පල කරයි.

---

වාමාංශික දේශපාලනයේ ක්‍රියාකාරිකයෙක් වූ ක්‍රිෂාන්ත නානායක්කාර සහෝදරයාගේ අකල් මරණය ගැන ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ සංවේගය පල කරයි.

# දේශපාලන වියදම් හෙලිදරව් කල යුතුයි.

කිවිදින වේදිකාව විසින් නිවේදනයක් නිකුත් කරමින් පසුගිය මැතිවරණයේදී නිදහස් හා සාධාරණ මැතිවරණය පවත්වා හිංසනය හා නීති විරෝධී ක්‍රියා අවම මට්ටමකින් පවත්වාගෙන යාමට මැතිවරණ නිලධාරින් ගත් උත්සහය අගේ කර තිබේ. එසේම දේශපාලන පසු හා අපේක්ෂකයන් විසින් මැතිවරණ වියදම් ලැබුණු ආකාරයත් වියදම් කිරීම පිලිබඳවත් ජනතාවට දැන ගැනීමට හැකි වෙන පරිදි ප්‍රතිඥා කල කල යුතු බවට ද ඉල්ලා ඇත. එසේම 20 වෙන ව්‍යවස්ථා සංශෝධනයේදී අවශ්‍ය නව විධිවිධාන ව්‍යවස්ථාවට ඇතුලත් කර ගත යුතු බව ද ඉල්ලා සිටි.

මේ පිලිබඳව කරුණු දක්වමින් ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ දන්වා ඇත්තේ මැතිවරණ වියදම් සීමාවන් පැවතීම පිලිගන්නා අතරම, මැතිවරණ ආධාර ලබා ගැනීම හෙලි කිරීම ඒවා ලබා දෙන අයගේ කැමැත්ත මත සිදු විය. එසේම ජාතික ලැයිස්තුව පිලිබඳ සම්මත වු පනත හා මුද්‍රිත පනත වෙනස්ය යන කරුණට අපි මුළුමනින්ම එකග වෙමු. එසේම පක්ෂ මාරු කිරීම නිසා මන්ත්‍රීවරුන්ගේ අසුන් අහිමි නොවිය යුතු අතර දේශපාලන සන්ධාන ගැනීම වෙනස්කම් අනුව සිදුවන බැවින් ඉල්ලා අස්වී නැවත ඡන්දයකට යාමේ ඉඩකඩක් තිබිය යුතුය. එය වඩාත් යුක්ති සහගත විනිශ්චයක් ද වන බව පෙන්වා දී තිබේ.

මේ අනුව ජනාධිපතිවරණ හා මහාමැතිවරණ ඡන්ද ක්‍රියාවලියේදී ලක්ෂ ගණනක් ජනතාව මෙම ක්‍රියාදාමයට විරුද්ධව මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත ඡන්දය පාවිච්චි කර තිබේ එම පිරිස නිදහස් සන්ධානයෙන් හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායක ලෙස මෛත්‍රීපාල මහතා නොපිලිගනී. එය ඔබගේ දැනීම අනුව පිලිගත හැකි ප්‍රජාතන්ත්‍රවාදී පිලිතුරක්ද? යන මතය ඇත එසේම තම පක්ෂ අපේක්ෂකයන් වත්කම් ප්‍රකාශ භාර දී ඇති අතර මැතිවරණ වියදම් ප්‍රකාශ කිරීමට ද කැමැත්ත දක්වා ඇති බව වාර්තා වේ.

ශක්තිය



අර්ථසාධක අරමුදල අහෝසි කිරීමට විරුද්ධව විපක්ෂ ඒකාබද්ධ වෘත්තීය සමිති සාකච්ඡාවේදී වාසුදේව සහෝදරයා විසින් යූ.ඇන්.පී. ය පරාජය කරන ඒකාබද්ධ විපක්ෂ වැඩපිළිවෙල පිළිබඳ පොත නිකුත් කර වෘත්තීය සමිති නායකයින්ට පිළිගැන්වූ අවස්ථාව.

# අර්ථ සාධක අරමුදල් සුදුවට සියලු වෘත්තිය සමිති විරුද්ධයි

අර්ථ සාධක අරමුදල් ධනපති සමාගම්වල කොටස් මිලදී ගැනීම සඳහා යෙදවීමෙන් එම මුදල් අනාරක්ෂිත වන හෙයින් අරමුදලේ ආරම්භයත් අරමුණු කර ආකාරයෙන්ම එම අරමුදල් මහ බැංකුවේ ආරක්ෂාව යටතේම තිබිය යුතු බව එක්සත් ජාතික පක්ෂයට හිතවත් ජාතික සේවක සංගමයේ නියෝජිතයෙක් නිර්නාමිකව ශක්තියට පැවසීය. කෙසේ වුවත් අර්ථ සාධක අරමුදල බේරා ගැනීම සඳහා පක්ෂ භේදයකින් තොරව උද්ඝෝෂණ කිරීම තම සමිති සූදානමින් සිටින බවට ඔහු තවදුරටත් පැවසිය. මෙම ආණ්ඩුව බලයට ගෙන ඒම සඳහා දර දිය ඇදපු වෘත්තිය සමිති සන්ධානයක නායකයෙකු පැවසුවේ වෘත්තිය සමිති නොවීමසා කිසිම පියවරක් මේ සම්බන්ධයෙන් ගැනීමට ඉඩ හැර තම සන්ධානය නිහඬ නොවන බවය.




මෙම අර්ථ සාධක අරමුදල්වල අයිතිකරුවන් වන්නේ තනිකරම සේවකයින් පමණක් නිසා ඒ ගැන තීන්දු තීරණ ගන්න කොයි කාටවත් ඉඩ දී අපි බකන් නිලාගෙන ඉන්නේ නැතැයි අරමුදලේ සාමාජිකයෙකු- වූ ඇහැලියගොඩ සෝමදාස සහෝදරයා පැවසීය. දැනට තිබෙන නීතිය අනුව අර්ථ සාධක අරමුදලේ සියයට දහයක ප්‍රමාණයක් ලාභ ඉපයීම සඳහා සමාගම්වල කොටස් මිලදී ගැනීමට යෙදවිය හැකිය. පසුගිය රජය කාලයේ සමහර මෙබඳු ආයෝජන නිසා අලාභ සිදුවී ඇත. එහෙත් ලාභ ලැබුණු අවස්ථා ද වේ. යූ.එන්.පී. එකේ දැනට සිටින අර්ථශාස්ත්‍රඥයන් දෙපලක් මෙයට විරුද්ධව මරහඬ නැගුවා අපට මතකය. කෙසේ වෙතත් 2008 සිදු වුවක් මෙන් සමස්ථ වශයෙන්ම ජාත්‍යන්තරව ගලා යන ආකාරයෙන් කොටස් වෙළඳපොලවල් බිඳ වැටුනහොත් අපේ සේවකයින්ට ඔවුන්ගේ එම මුදල අහිමි වීමට පුලුවන.

ලෝක ආර්ථික තත්වය තිබෙන්නේ හොඳ මට්ටමක නොවන බවත් පෙනෙන ඉදිරි අනාගත කාලයක් තුල ජාත්‍යන්තර කොටස් වෙළඳපොලවල්හි ඉහල යන හෝ පවතින තත්වය රැක ගැනීමත් අසීරු වන්නේ ලෝකයේ සෑම කලාපයකම පාහේ ආර්ථික ක්‍රියාකාරිත්වය මන්දගාමීව පවතින හෙයින් බව ආර්ථික විද්‍යා ගුරුවරයෙක් ශක්තිය පැවසීය.

දැනුදු සමහර රටවල කොටස් වෙළඳපොලවල්හි හිටි හැටියේ සිදුවන කඩා වැටීම් නිසා ඩොලර් මිලියන ගණන් වලින් කොටස් හිමියන්ට අලාභ සිදු වන බවට ඔහු පෙන්නුවේය. මෙය සූදු කෙලිමටත් වඩා අවදානම්ය. මේ අතර කොටස් වෙලදපොල තුල නොයෙක් මගඩි සිදු වන බව එම සූදු වෙළඳසැලේ අධ්‍යක්ෂ වරයාව සිටි කරුණාරත්න මහතා පවසා ඇත. ඔහු ද පසුව පත් කල වීරතුංග මහත්මිය ද ඉවත් වුයේ මේ හේතුවෙන්ය. පාර්ලිමේන්තුවේ සේවකයෙක් කොටස් වෙළඳපොලේ සුලු වශයෙන් මුදල් යෙදවුයේය. ඔහු දැන් කොටස් වෙළඳපොලෙන් ඉවත්ව සිටින්නේ ද විශාල කොටස් ගැනුම් කරුවන් කල්ලි ගැසී කුඩා කොටස් ගනුදෙනුකරුවන් අලාභයට පත් කරමින් සිදු වන අයථා ක්‍රියාවන් බව ඔහු ශක්තියටය පැවසීය. කොටස් වෙළඳපොලත් බිඳ වැටී ආර්ථික අර්බුදය මැද ආණ්ඩුව ද කුලල් කාගෙන බිඳ වැටී උද්ගතවන තත්වය තුල සේවකයන්ට සිදු වන්නේ තම අර්ථ සාධකය පාඩුවට නොව විනාශයට පත්වී අකුලා ගෙන සිටීමටය.

## ජනතා වීරෝධී ආණ්ඩු පාලනය බේරා ගැනීමට ජාතිවාදී ආරවුල්

අර්ථසාධක අරමුදල ගැන වෘත්තීය සමිති නියෝජිතයන්ද නිදහස් අධ්‍යාපනය සුරැකීම සඳහා දැනට ක්‍රියාත්මක වන විවිධ නිදහස් අධ්‍යාපන විරෝධි ප්‍රතිපත්ති ඉවත්කර ගැනීම සඳහා ශිෂ්‍ය සංගම් නියෝජිතයන්ද, ඔහු නොවුන් හමුවී, තමන්ගේ බලපෑම් ඒකාබද්ධ කලයුතු බව වෘත්තීය සමිති නියෝජිතයෙකු සමග ශක්ති කාර්යාලයට සරසවි ශිෂයෙක් පවසා සිටියේය. මෙම තත්ත්වය ගැන බියට පත්වසිටින ආණ්ඩුවේ යම් කොටස් ජාතිවාදී ආරාවුල් මතු කරවා ශිෂ්‍යන්ගේ හා සේවකයන්ගේ එකමුතු වු බලපෑම් අවුල් කර යටපත් කර දැමීමට සිතන බවද ශක්තියට සැල වී තිබේ. 1983 ජූලියේ සිදුවූ ජාතිවාදී කෝලහාලය ඇවිලවූයේ එදා සිටි යම් ඇමතිවරුන් විසින් බව ඉතිහාස ගතවූ කරුණකි. මේ වෙලාවේ මෙය සිහිපත් කිරීම වටී. අගමැතිතුමා මේ දිනවල බොහෝසෙයින් කථාකරන්නේද ආගමික හා ජාතික සමගිය ගැනය

## තේ රබර් උද්ඝෝෂණය පැතිරේ

### දිස්ත්‍රික්ක 08ක පලාත් ඡන්ද තීන්දු වන්නේ තේ රබර් මිල අනුවයි

තේ රබර් සහන මිල ගෙවීම් සම්බන්ධයෙන් එ.ජා.ප ප්‍රමුඛ සන්ධානය අතුරු අයවැයෙන් දුන් පොරොන්දු කඩකර ඇති බවද එය මැතිවරණය සඳහා ජනතාව රැවැට්ටීමට කරන ලද ගැලවිජ්ජාවක් බවද තේ හා රබර් කට්ටිකරුවන්ගේ සංවිධාන වලින් අසන්නට ලැබේ. ඒ සම්බන්ධයෙන් රජය නෙකෙරෙන යෝජනාවක් දැනට ප්‍රකාශ කර ඇතත් එයද තවමත් ක්‍රියාවට නැගී නැත. රබර් පිළිබදව එබදු ප්‍රකාශයන්වත් ලැබී නැත. රජයේ මෙම පිළිවෙත ලක්ෂ ගණනක් මිනිසුන්ගේ හා දරුවන්ගේ ජීවිත සමග සෙල්ලම් කිරීමකි.
තේ සමිතියක සභාපතිවරයෙක් ශක්තියට පැවසුවේ දැනට ලැබෙන මුදලේ වටිනාකමද ඩොලරයට සාපෙක්ෂව රුපියල් 10 කින් පහළ වැටුනු රුපියලේ වටිනාකම අනුව ගනන් බැලිය යුතු බවය.
තවද තේ කම්හල්වල වියදම් අඩුකර ගතයුතුයැයි කියමින්, දළුවල බරින් කොටසක් කපනු ලැබේ. මේ හැම දඩ පනතකටම යටත් වී දළු දෙනවා හැර දුප්පත් අපට කරන්නට වෙන දෙයක් නැතැයි පැවසුවේ දුප්පත් තේ කට්ටිකරුවෙකි. රබර් කට්ටි කරුවන් මේ දිනවල ජීවත්වන්නේ රබර් ගස් පිටින් කපා විකුණා දැමීමෙනි.
රබර් රොටි දෙකක් විකුණා කඩෙන් තුණපහ ගෙනආ ගෘහනිය අද අනාත වී සිටී. රබර් සඳහා කොහොමත් ගැණුම් ගරුවන් සොයා ගැනීමද දුෂ්කර කාර්යයක් වී ඇතැයි පැවසේ. තේ රබර් ගොවියන් මේ දිනවල කියනු ඇසෙන්නේ එකම කථාවකි. ප්‍රාදේශිය සභාව සඳහා චන්දය විටෙක මේ අපරාධයට අපි ආණ්ඩුවටම හොදින් පිළිතුරු දෙනවා කියාය. ඉදිරි පාලත් පාලන ඡන්ද ක්‍රමය කොට්ඨාශ අනුපාත ක්‍රමයකට වෙනස් කිරීමේ ප්‍රජාතන්ත්‍රවාදී තීරණය මිනිසුන් මෙම විරෝධයට මුහුණ දීමේ අවියක් ලෙස යොදා ගැනීමේ අදහස රජය මේ දිනවල සලකා බලමින් සිටීම පුද්ගලයා මුල්කරගත් ඡන්දයක් වන නව ඡන්දක්‍රමය යටතේ පක්ෂ විරෝධය දැනෙන්නේ අඩුවෙන් යැයි රජය ගනන් බලන බව පෙනේ කෙසේ වුවද ආණ්ඩුවට ගෑවුනු එකෙකුට ඡන්දයක් දෙනවා නිසා අපේ ගෙයක් ලගින් ඕකුන්ට යාමටවත දෙන්නේ නැතැයි කුඩා තේ කට්ටියක් අයිති කාන්තාවක් පවසා ඇති බව අපගේ නිවිතිගල වාර්තාකරු පවසයි.




## තෙල් මිල අඩුවීමේ වාසිය ලංකාවට අහිමි ද

### රුපියලේ මිල අඩු වීම තේ, රබර් වගාකරුවන්ට අහිමි ද

බන්දුල ගුණවර්ධන පසුගිය දිනක ඒකාබද්ධ විපක්ෂයේ කෑගල්ල සමුළුව උත්සවාකාරයෙන් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හා කෑගලු ජනතා සමුළුවේ කැඳවුම්කරු වන වයි.ජී. පද්මසිරි සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් රුවන්වැල්ල එස්.එම්. පෙරේරා සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විනි.
මෙම සමුළුව අමතමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී බන්දුල ගුණවර්ධන මන්ත්‍රීවරයා ප්‍රකාශ කරනු ලැබුවේ ලෝකයේ තෙල් මිල සීග්‍රයෙන් පහල යමින් පවතින අතර එම වාසිය ජනතාවට ලබා නොදෙන්නේ කු-මන හේතුවක් නිසා දැයි ප්‍රශ්න කලේය.
රුපියලේ වටිනාකම අඩුවීම නිසා තේ රබර් සඳහා විදේශ ගනුදෙනුවලද වාසියක් රජය ලබා ගත්තත් තේ රබර් වගාකරුවන්ට ලබා නොදෙන්නේ කුමන යහපාලන ක්‍රමයක් නිසාදැයි ප්‍රශ්න කලේය.
සමුළුවේ අදහස් දැක්වූ වයි.ජී. පද්මසිරි හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා සඳහන් කරනු ලැබුවේ යූ.එන්.පී. ය සමග එකග වී හංස පූට්ටුවක් හැදීමට නොවන බවය. මහින්දගේ නම විකුණමින් ලබාගත් ජයග්‍රහණය ජාතික ලැයිස්තුව කොල්ලකමන් ජනවරම පාවා දෙමින් යූ.එන්.පී. සන්ධානයේ තනතුරු භාර ගැනීම පිලිකුල් සහගත දේශපාලනය බව පෙන්වා දුන්නේය. තවදුරටත් කථා කරමින් පද්මසිරි සහෝදරයා පෙන්වා දුන්නේ ජිනිවා මානව කොමිෂන් යෝජනාව හරහා යූ.එන්.පී. හවුල රට පාවාදීමක් ගෙන යන බවත්, කෙටි කලකදී වුව ආණ්ඩුව ගත් පියවරවලින් රුපියල කඩා වැටී, ජීවන වියදම ඉහල නගා තේ, රබර් වී මිල පහල වැටීම නිසා ගොවි ජනතාවට කබලෙන් ලිපට වැටුන තත්වයකට පත් වෙන බවයි. සහනාධාර බොරු පොරොන්දු පමණක් වි ඇති අතර මෙවර අයවැයෙන් ද තවත් කප්පාදුවකට සූදානම් වන බවත් ජනතාවගේ එකම අයිතිය වී ඇත්තේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා අනෙකුත් සන්ධාන මන්ත්‍රීවරුන් 50 ක් පමණ එක්වෙමින් ආණ්ඩුවේ පිටත විපක්ෂය ද සමගාමී කර ගනිමින් ඒකාබද්ධ විපක්ෂයේ ක්‍රියාමාර්ගයයි. එබැවින් එම බලවේගය යූ.එන්.පී. ආණ්ඩු සභාගය බිඳ දමා ජනතාවාදී ඊලග ආණ්ඩුව හැදීම සඳහා නායකත්වය දෙනු ඇතැයි ප්‍රකාශ කලේය.
මෙම සමුළුවට සමසමාජ පක්ෂ නායක මහාචාර්ය තිස්ස විතාරණ සහෝදරයා, ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර සහෝදරයා පිවිතුරු හෙළ උරුමයේ නායක ගම්මන්පිල මහතා හා ජාතික නිදහස් පෙරමුණ කෑගල්ල සංවිධායක ද සහභාගී විය

කොළඹ 10, විනයාලංකාර මාවත, 49/1 එඩ්වින් මුද්‍රණාලයේදී, මුද්‍රණය කර ප්‍රකාශ කරන ලදී.